# මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව

# இலங்கை தேசிய மனிதவள அபிவிருத்தி சபை

# NATIONAL HUMAN RESOURCES DEVELOPMENT COUNCIL OF SRI LANKA

## වාර්ෂික වාර්තාව

## ஆண்டு அறிக்கை

## ANNUAL REPORT

## 2016

ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය

**Ministry of National Policies and Economic Affairs**

**தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார விவகாரங்கள் அமைச்சு**

354/2, නිපුණතා පියස, 7 වන මහල, ඇල්විටිගල මාවත, කොළඹ 05

354/2, 7 ஆம் மாடி, நிபுனதா பியச, எல்பிடிய மவாத்தை கொழும்பு - 05

354/2, NIPUNATHA PIYASA, 7TH FLOOR, ELVITIGALA MAWATHA, COLOMBO 05.

## ආයතනික පසුබිම

| | | |
|---|---|---|
| ආයතනය | : | මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව |
| අමාත්‍යාංශය | : | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය |
| ලිපිනය | : | 354/2, 7 වන මහල, නිපුණතා පියස, ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05 |
| ඊ මේල් ලිපිනය | : | development.nhrdc@gmail.com |
| වෙබ් අඩවිය | : | www.nhrdc.gov.lk |
| දුරකථන අංකය | : | 0112595680 |
| ෆැක්ස් | : | 0112595680 |
| බැංකු කරුවන් | : | ලංකා බැංකුව<br>මහජන බැංකුව |

## දර්ශනය

අනාගතය සඳහා සූදානම් ශ්‍රම බලකායක්

## මෙහෙවර

රටෙහි මානව සම්පත් සංවර්ධනය උදෙසා ඵලදායි ප්‍රතිපත්ති හා නව්‍යකරණ උපායමාර්ග සංවර්ධනය කිරීම, ක්‍රියාත්මක කිරිම, ප්‍රවර්ධනය කිරීම හා පහසුකම් සැලසීම

## අගයන්

- සාමූහිකත්වය
- නිර්මාණශීලිත්වය
- පාරිභෝගික නැඹුරුතාව
- වෙනස්වීමකට භාජනය නොකිරීම

## සභාපතිතුමාගේ ප්‍රකාශය

1997 අංක 18 දරණ මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභා පනතින් මෙම සභාව කෙටි කාලයක් තුල අමාත්‍යාංශ රැසකට අනුබද්ධවී කටයුතු කර ඇති අතර 2016 වර්ෂය වනවිට ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය යටතේ සිය කටයුතු පවත්වා ගෙන යනු ලබයි.

2016 වර්ෂය වන විට සියළුම කාර්ය මණ්ඩල බඳවා ගැනීම් සිදු කර මෙම ආයතනය සංස්ථාපනය කරන ලද පනතින් අපේක්ෂිත කාර්ය භාරය අනුව පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘතින් සංවිධානය කරන ලද අතර ඉදිරි පර්යේෂණයන් සඳහා එසේ සැළසුම්කල ව්‍යාපෘති ඇසුරෙන් සංයුක්ත සැළැස්මක් සකස් කර එහි අන්තර්ගත දැක්ම සාක්ෂාත් කරගැනීම සඳහාත් හඳුනාගත් මෙහෙවර ඉටුකිරිම සඳහාත් මහා භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන වියදම් ලෙස වෙන් කෙරුණ රුපියල් මිලියන 15.5 ක මූල්‍ය සීමාව යටතේ 2016 ක්‍රියාත්මක සැළැස්ම සකස්කර ඇත.

මෙම සැළැස්මේ ව්‍යාපෘතීන් තෝරා ගැනීමේදී අදාල පනතේ 14.1 වගන්තියෙන් දක්වා ඇති ප්‍රධාන ක්ෂේත්‍රයන් අනාවරණය වන පරිදි ව්‍යාපෘතීන් හඳුනා ගෙන ඇති අතර එම ප්‍රධාන ක්ෂේත්‍රයන් වනුයේ

(a) රැකීරක්ෂා, පුහුණුව සහ අධ්‍යාපනය

(b) විද්‍යාව සහ තාක්ෂණය උපයෝගී කර ගැනීම

(c) ජීවන තත්වය නංවාලීම

(d) අවාසිකර තැනැත්තන්ගේ කණ්ඩායම් සඳහා සමාජ ආරක්ෂාව සැලසුම් කිරීම

(e) ආර්ථික ප්‍රතිසංස්කරණ මගින් හිමිකම් රැකදීම සම්බන්ධයෙන් වන හෝ අදාළ වන මානව සම්පත් බණ්ඩ පරිමෙය කිරීම සහ සමෝධානය කිරීම වේ.

2016 වර්ෂය තුළදී, ‘‘අනාගතය සඳහා සූදානම් ශ්‍රම බලකායක්’’ යන දැක්ම සහිත මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව ශ්‍රී ලංකාවේ මානව සම්පත සංවර්ධනය කිරීම වෙනුවෙන් කාර්යක්ෂම සහ සඵලදායී සේවාවක් සැපයීම උදෙසා පහත වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත.

# 2016 වර්ෂයේ ක්‍රියාත්මක කළ ව්‍යාපෘති

### කළමනාකරණ නිපුණතා සංවර්ධන වැඩසටහන 2016 (MCDP)

ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාව යනු රටේ මානව සම්පත් සංවර්ධනය සඳහා වූ ප්‍රතිපත්ති නිර්දේශ කිරීම හා පාලනය කිරීම සඳහා වගකිව යුතු ශීඝ්‍රයෙන් වර්ධනය වන ආයතනයකි.

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාවෙහි "අපගේ අනාගතය සඳහා සූදානම් ශ්‍රම බලකායක්" යන දැක්ම යටතේ මැලේසියාවේ පුත්‍රා විශ්වවිද්‍යාලය සමග ඒකාබද්ධව රාජ්‍ය අංශයේ කළමනාකාර මට්ටමේ කාර්ය මණ්ඩලය සඳහා කළමනාකරණ නිපුණතා සංවර්ධන වැඩසටහන් දෙකක් සාර්ථකව පවත්වන ලදී. මෙම වැඩසටහන්වල ප්‍රධාන අරමුණ වූයේ රාජ්‍ය අංශයේ කළමනාකාර මට්ටමේ කාර්ය මණ්ඩලයන්හි නිපුණතා ශක්තිමත් කිරීමයි. මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා මෙම වැඩසටහන් දෙක දේශීය සහ විදේශ සැසි ලෙස සැසිවාරයන් දෙකකින් සමන්විත වූ අතර, එක් එක් සැසිය විවිධ ආයතනවල කළමනාකාර මට්ටමේ කාර්ය මණ්ඩලයට අවශ්‍ය විවිධ දක්ෂතා ඉලක්ක කර ගන්නා ලදී.

### ශ්‍රී ලංකා මානව ප්‍රාග්ධන සමුළුව - 2016

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව සහ ශ්‍රී ලංකා මානව සම්පත් වෘත්තීයවේදීන්ගේ සංගමය (AHRP) මගින් 2016 අගෝස්තු 11- 12 වන දින දක්වා ශ්‍රී ලංකා මානව ප්‍රාග්ධන සමුළුව - 2016 සංවිධානය කරන ලදී. ලංකා සේවක සම්මේලනය, අන්තර් ජාතික කම්කරු සංගමය, ආසියානු සංවර්ධන බැංකුව හා ලෝක බැංකුව යන අනේකවිධ පාර්ශ්වකරුවන් සහ සහායක හවුල්කරුවන්ගෙන් මෙම සම්මේලනය පෝෂණය වූ අතර, මානව සම්පත් අභියෝග සඳහා විසඳුම් සොයා ගැනීමත්, තරඟකාරී වාසියක් වර්ධනය කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමත් මෙම සමුළුවේ තේමාව විය.

සමුළුව ප්‍රධාන වර්ධන ක්ෂේත්‍රයන් පිළිබඳ අවධානය යොමුකළ අතර, ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය සහ ආගන්තුක සත්කාරක, සේවා, නිෂ්පාදන හා ඉදිකිරීම් සහ විදේශ රැකියා යන අංශ හතර සඳහා ශ්‍රී ලංකාව තුළ පවතින අවස්ථාවන් ඉස්මතු කර දක්වන ලදී.

### සංචාරක හා සත්කාරක අංශ ආවරණය කරමින් කලාපයන්හි රැකියා අවස්ථා පිළිබඳ දැනුවත් කිරීම

ඉහත සඳහන් කළ හවුල්කරුවන් හා එක්ව රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සහයෝගීත්වය ඇතිව සංචාරක කර්මාන්ත අංශය වෙනුවෙන් කුසලතා සපිරි දායකත්වයක් සහතික කරමින් පාසැල් හැරගිය සිසුන් ආකර්ෂණය කරගැනීම සහ ඔවුන්ගේ සහභාගිත්වය ඉහළ නැංවීම සඳහා සංචාරක කර්මාන්තය පිළිබඳ

දැනුවත්කිරීමේ වැඩසටහනක් මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාව විසින් පවත්වන ලදී. මෙම දැනුවත් කිරීමේ වැඩසටහන්වල අවසන් අරමුණ වනුයේ දීර්ඝකාලීනව රැකියා වියුක්ති අනුපාතය අඩු කිරීමට සහ මෙම කර්මාන්තයන්හි කුසලතා හිඟය සඳහා විසඳුමක් ලබාදීමට හැකිවන ලෙස අදාළ පුහුණු පාඨමාලා හැදෑරීමට පාසැල් හැර යන සිසුන්ව උනන්දු කරවීමයි.

**KPMG සමඟ රාජ්‍ය අංශයේ කළමනාකරණ කාර්ය මණ්ඩල නිපුණතා සංවර්ධන වැඩසටහන**

රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යංශයේ විෂය පථය යටතේ සියලුම රාජ්‍ය ව්‍යවස්ථාපිත ආයතන (SOEs) සඳහා පරිපාලන කටයුතු පිළිබඳ වැඩසටහනක් KPMG වරලත් ගණකාධිකාරීවරුන් මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාව සමග ඒකාබද්ධව සිදුකරන ලදී.

**ප්‍රතිපත්ති ප්‍රකාශනය**

අධ්‍යාපන හා පුහුණු ආයතන විසින් ලබා දෙන කුසලතාවන් හා කරමාන්තය සොයන කුසලතා අතර ඇති පරතරය විසඳීමට ප්‍රතිපත්ති විකල්පයන් නිර්දේශ කිරීම සඳහා අධ්‍යයන කණ්ඩායම් හතරක් පිහිටුවා ඇත.

**සත්කාරක කර්මාන්තය සඳහා CMA, SLITHM** යන ආයතන **ඒකාබද්ධ වෘත්තීය මූල්‍ය හා කළමනාකරණ ගිණුම්කරණ පාඨමාලාවක් පැවැත්වීම**

සත්කාරක කර්මාන්තය සඳහා ඒකාබද්ධ වෘත්තීය මූල්‍ය හා කළමනාකරණ ගිණුම්කරණ පාඨමාලාවක් පැවැත්වීම සඳහා ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය සහ ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය සත්කාරක අංශය සඳහා මූල්‍ය, ගිණුම්කරණ හා කළමනාකරණ ගිණුම්කරණය සම්බන්ධ වෘත්තීය අධ්‍යාපනික වැඩසටහන් උත්පාදනය කිරීමේ ප්‍රතිලාභ හඳුනා ගනිමින් ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකරණ ආයතනය (CMA), ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය (SLITHM) සමඟින් වරලත් සත්කාරක මූල්‍ය සහ කළමනාකරණ ගණකාධිකරණ (CHFMA) වැඩසටහන දියත් කිරීමට අප සභාව විසින් පහසුකම් සලසා දුනි.

සත්කාරක කර්මාන්තය සඳහා මූල්‍ය හා කළමනාකරණ ගිණුම්කරණය පිළිබඳ දුර්ලභ වෘත්තීය වැඩසටහනක් සඳහා වත්මන් අවශ්‍යතාව මෙම මූලාරම්භය තුළින් හඳුනාගෙන ඇත. මෙම සුදුසුකම් ලබාගන්නා තැනැත්තන්හට සුදුසුකම් ලත්, ප්‍රවීණ මූල්‍ය හා කළමනාකරණ ගිණුම්කරණ වෘත්තිකයන් ලෙස සත්කාරක කර්මාන්තය තුළ රැකියා අවස්ථා ලබා ගැනීමට හැකියාවක් ඇත.

**ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත අංශය ප්‍රවර්ධනය සහ සවිබල ගැන්වීම සඳහා වන ව්‍යාපාර කුසලතාවයන් ශක්තිමත් කිරීම සඳහා පුහුණු වැඩසටහනක් පැවැත්වීම**

වර්තමානයේදී දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ නිසි දත්ත සටහන් හෝ විස්තරයක් සකසා නොමැති අතර, සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර හිමියන්ට තවමත් ග්‍රාමීය මට්ටමින් අදාළ පාර්ශවකරුවන් හා සේවා සපයන්නන් අතර නිසි සම්බන්ධතා ජාලයක් සකස් වී නොමැත.

එසේම ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාවසායකයන්හට මූල්‍ය කළමනාකරණය, පවත්නා සේවා සඳහා වන ප්‍රවේශය, අනෙකුත් ආයතන සමඟින් ජාලගත වීම, ඔවුන්ගේ නිෂ්පාදන අලෙවිකරණය හා ප්‍රවර්ධනය කිරීම සහ තාක්ෂණික වැඩිදියුණු කිරීම් හා සබැඳි නිපුණතා සංවර්ධනය කිරීම වැනි අභියෝග රැසකට මුහුණ දීමට සිදු වී ඇත.

මෙම වැඩසටහනේ පරමාර්ථය වන්නේ කර්මාන්ත නිෂ්පාදන (ගඩොල්, වඩු කර්මාන්තය, කුළු බඩු නිෂ්පාදන, රෙදිමැසීම, ඉදිකිරීම්), සේවාවන් (කොණ්ඩා මෝස්තර, ගරාජ, කාර්මික ශිල්පීන්, කම්මල්, තොග සහ සිල්ලර වෙළඳාම, උකස් මධ්‍යස්ථාන, පැස්සීම්, ජ්‍යොතිෂ්‍ය, ආපනශාලා, නිවාස හා මෝටර් රථ අලෙවි, වාහන කුලියට දීම්) සහ කෘෂිකර්ම (පශු සම්පත්, වැවිලි, උද්‍යාන විද්‍යාව) ක්ෂේත්‍ර ඇතුළත්ව ප්‍රාදේශීය සහ දිස්ත්‍රික් මට්ටමින් විවිධ ව්‍යාපාර සහ ස්වයං රැකියාවන්හි යෙදී සිටින කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යාවසායකයින් බලගැන්වීම සහ දිරිමත් කිරීමයි.

**රාජ්‍ය අංශයේ කළමනාකරණ කුසලතා වර්ධනය කිරීම සඳහා මානව සම්පත් ක්‍රමවේදයක් නිර්මාණය කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රවීණතා රාමුවක් සකස් කිරීම**

රජයේ සහ අර්ධ රාජ්‍ය අංශයේ සුදුසු පුද්ගලයින් සුදුසු රැකියා සඳහා තෝරාගැනීමේ සහ ඔවුන්ට උසස්වීම් ලබාදීමේ නිවැරදි ක්‍රමවේදයක් මෙතෙක් සකස් කර නොමැත. ඒ සඳහා විසඳුමක් ලෙස රාජ්‍ය සේවකයින්ගෙන් කාර්යක්ෂම, ඵලදායී හා ගුණාත්මක සේවාවක් ලබා ගැනීම ඉලක්ක කර ගනිමින් අපගේ සභාව විශේෂඥ කණ්ඩායමකගේ ද සහයෝගය ඇතිව රාජ්‍ය අංශය සඳහා පොදුවේ පිළිගත් ප්‍රවීණතා රාමුවක් සකස් කර ඇත.

ඊට අමතරව පොදු මහජනතාව වෙනුවෙන් කාර්යක්ෂම සහ ඵලදායී සේවාවක් සැපයීම පිණිස ඔවුන්ගේ දැනුම සහ කුසලතා වැඩි දියුණු කරලීම සඳහා රාජ්‍ය අංශයේ නිලධාරීන් බලගැන්වීමේ අරමුණින් " HR for Non HR ", “Motivate Your Self and your Team", "රාජ්‍ය අංශයේ සේවා සැපයුම වැඩිදියුණු කිරීම සඳහා මානව සම්පතේ කාර්යභාරය", "ජීවන මාර්ගයක් ලෙස වෘත්තීයවේදය" යන මාතෘකාවන් යටතේ දේශන මාලාවක් පවත්වනු ලැබීය.

**"රැකියා අරුණ" වෘත්තීය අභිප්‍රේරණ වැඩසටහන**

පෞද්ගලික අංශයේ පවත්නා රැකියා පිළිබඳ පවතින ඍණාත්මක ආකල්ප වෙනස් කිරීම හා ස්වකීය සුදුසුකම් අනුව ඔවුන් පෞද්ගලික අංශයට යොමු කිරීම පිණිස පාසැල් හැරගිය සිසුන්හට ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) ලබාගැනීම උනන්දු කරවීම සඳහා මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව විසින් ''රැකියා අරුණ'' වෘත්තීය අභිප්‍රේරණ වැඩසටහන් පවත්වන ලදී.

2016 වර්ෂයේදී ජාතික වාණිජ මණ්ඩලය, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, වෘත්තීය පුහුණු ආයතන, කොට්ඨාශ අධ්‍යාපන කාර්යාල සහ ඇතැම් පෞද්ගලික සමාගම්වල සහයෝගිත්වයෙන් කළුතර, රත්නපුර, මහනුවර සහ කොළඹ යන දිස්ත්‍රික්කවල වැඩසටහන් 4 ක් පවත්වන ලදී.

**දැනුම කළමනාකරණය**

දැනුම කළමනාකරණය හඳුන්වාදීම හා අභ්‍යන්තර ශක්තිය ගොඩ නැංවීම සඳහා ආරම්භක පියවරයන් 2016 වර්ෂයේදී සිදු කරන ලදී. නිර්මාණශීලිත්වය සහ සන්නිවේදනය වැනි සංවේගාත්මක කුසලතා දැනුම පදනම් කරගත් ආර්ථිකයේ ඇති වත්කම් වන අතර, නූතන ආර්ථිකයේ පොදු භාෂාව ලෙස ඉංග්‍රීසි භාෂා හැකියාව ශක්තිමත් කිරීම අවශ්‍ය වී ඇත.

**ශ්‍රී ලංකා ජාතික මානව සම්පත් සංවර්ධන සභාවේ ඵලදායීතාවය හා ප්‍රමිතිය ඉහළ නැංවීම.**

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් සිදු කරන ලද විගණනයට අනුව, රටේ මානව සම්පත් සංවර්ධනය වෙනුවෙන් කාර්යක්ෂම හා ඵලදායි සේවාවක් සැපයීම සඳහා ISO 90001: 2015 නිර්දේශයන්ට අනුව කටයුතු කිරීම සඳහා සභාවේ සභාපතිවරයා මම වශයෙන් සතුටු වෙමි.

''අනාගතය සඳහා සූදානම් ශ්‍රම බලකායක්'' යන දැක්ම ඉලක්ක කරගනිමින් ප්‍රමිති කළමනාකරණ පද්ධතියට අනුකූලව ගුණාත්මක සේවාවක් ලබා දීමට අපි කැපවී සිටින්නෙමු.

දිනේෂ් වීරක්කොඩි
සභාපති

# පටුන

1.ආයතනික පසුබිම හා විෂය පථය ........................................ 1

2. මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ සංවිධාන ව්‍යුහය........................................ 4

3.මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ සංවිධාන සටහන ........................................ 7

4.මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ සේවය කරන ලද සේවක ලැයිස්තුව හා ඔවුන්ගේ තනතුරු ........................................ 8

5. ව්‍යාපෘති සහ වැඩසටහන් ........................................ 12

5.1 කළමනාකරණ නිපුණතා සංවර්ධන වැඩසටහන 2016 (MCDP) ........................................ 12

5.2 ශ්‍රී ලාංකීය මානව ප්‍රාග්ධන සමුළුව 2016 ........................................ 17

5.3 සංචාරක සහ ආගන්තුක සත්කාරය පිළිබඳ වැඩමුළුවක් පැවැත්වීම මගින් කලාපය තුළ රැකියා අවස්ථා පිළිබඳ දැනුවත් කිරීම. ........................................ 18

5.4 හඳුනාගත් හවුල්කරුවන් සමඟ ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ක්ෂේත්‍රයේ ව්‍යාපාර හැකියාවන් ප්‍රවර්ධනය සහ ශක්තිමත් කිරීම ........................................ 21

5.5 KPMG සමඟ රාජ්‍ය අංශයේ කළමනාකරණ කාර්ය මණ්ඩල නිපුණතා සංවර්ධන වැඩසටහන ........................................ 23

5.6 ශ්‍රී ලංකා වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය හා ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය සත්කාරක කර්මාන්තය සඳහා ඒකාබද්ධ වෘත්තීය මූල්‍ය හා කළමනාකරණ ගිණුම්කරණය පිළිබඳ පාඨමාලාවක් පැවැත්වීම ........................................ 24

5.7 රාජ්‍ය අංශයේ කළමනාකරණ කුසලතා වර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් කිරීම පිණිස මානව සම්පත් උපාය මාර්ගයක් ගොඩ නැගීම........................................ 25

5.7.1 පොදු ප්‍රවීනතා රාමුව........................................25

5.7.2 දේශන මාලාව 2016 ........................................25

5.8 රැකියා අරුණ වෘත්තීය අභිප්‍රේරණ වැඩසටහන - 2016 ........................................ 30

5.9 පුවත් ලිපිය – මානව ප්‍රාග්ධන අන්තර් දෘෂ්ටීය ........................................ 31

5.10 මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව තුළ ඵලදායිතාව හා තත්ත්වය ඉහළ නැංවීම. ........................................ 32

5.11 2016 වසර තුළදී මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාවේ සිදු කරන ලද පර්යේෂණ වාර්තා හා ප්‍රකාශන ........................................ 33

6. 2016 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය ........................................ 34

7. 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය........................................ 36

8. 2016 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ශුද්ධ වත්කම්/කොටස් වල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය ........................................ 37

9. මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය........................................ 38

10. සටහන්........................................ 40

11. වැදගත් ගිණුම්කරන ප්‍රතිපත්තීන් සහ අනිකුත් අර්ථ විවරණ සටහන්වල සාරාංශයකින් සමන්විත සටහන්. 48

12. විගණන විමසුම් හා පිළිතුරු ........................................ 52

# 1.ආයතනික පසුබිම හා විෂය පථය

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව මානව සම්පත් සංවර්ධනය පිළිබඳ වැදගත් කාර්ය භාරයක් ඉටුකිරීමට 1997 අංක 18 දරණ මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභා පනතින් ස්ථාපිත කරන ලද ආයතනයකි. එම ආයතනයට ලබාදී ඇති බලතල යටතේ මානව සම්පත් සංවර්ධනයෙහිලා සියළු කටයුතු වලදී ප්‍රමුඛතාවය දීමටත් මානව සම්පත් සංවර්ධනය වෙනුවෙන් ප්‍රතිපත්ති උපනයනය කිරීමටත් ප්‍රවර්ධනය කිරීමටත් ක්‍රියාත්මක කිරීමට සහාය ලබා දීමටත් යනාදී වැදගත් කාර්යභාරයනට වගකීම දරයි. එහි මූලික අරමුණ වනුයේ අදාල අමාත්‍යවරයාටත්, රජයටත් මානව සම්පත් සංවර්ධනය සම්බන්ධයෙන් නිර්දේශ ලබා දෙන උසස් මට්ටමේ ආයතනයක් ලෙස සංවිධානය වීමයි.

## 1.1ආයතනික හැඳින්වීම

ජාතික මට්ටමේ උපදේශක මණ්ඩලයක් වශයෙන් 1987 ජුනි මස 05 වන දින මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව ආරම්භ වූයේ යෞවන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ඒකකයක් වශයෙනි. ඉන් ඉක්බිතිව 1997 අංක 18 දරණ මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභා පනත මඟින් ස්වාධීන ව්‍යවස්ථාපිත මණ්ඩලයක් ලෙස විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ ස්ථාපනය කරන ලදී. එතැන් සිට කෙටි කාලයක් තුලදී, එනම් 2000 වර්ෂයේදී මෙම ආයතනය කාර්මික අධ්‍යාපන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය යටතට පැවරෙන අතර, 2001 දී මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතට පවරනු ලැබීය. ඉන් පසු නැවත රජය වෙනස් වීමෙන් පසුව මෙම ආයතනය නිපුණතා සංවර්ධන, වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශයටත් ඉන්පසු යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ පාලනයට නතු කරනු ලැබීය. මෙසේ කෙටි කාලයක් තුල අමාත්‍යාංශ රැසකට අනුබද්ධවී කටයුතු කල මෙම ආයතනය වර්තමානයේදී **ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය** යටතේ සිය කටයුතු පවත්වා ගෙන යනු ලබයි.

### 1.2 දර්ශනය

"අනාගතය සඳහා සූදානම් ශ්‍රම බලකායක්"

### 1.3 මෙහෙවර

රටෙහි මානව සම්පත් සංවර්ධනය උදෙසා ඵලදායි ප්‍රතිපත්ති හා නව්‍යකරණ උපායමාර්ග සංවර්ධනය කිරීම, ක්‍රියාත්මක කිරිම, ප්‍රවර්ධනය කිරීම හා පහසුකම් සැලසීම

## 1.4 අරමුණ

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ අරමුණ වනුයේ රජයට මානව සම්පත් සංවර්ධනය සම්බන්ධයෙන් උපදෙස් සහ මාර්ගෝපදේශකත්වය දීමට සුදුසු ආයතනික රාමුවක් බිහිකිරීමයි. මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්ති ක්‍රියාවලි සැලසුම, ප්‍රතිපත්ති සමාලෝචනය හා මානව සම්පත් අංශ වර්ධනය කිරීමත් යනාදී අංශ සඳහා මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව වගකීම් දරයි. සභා පනතට අනුව සභාවේ කාර්ය සහ කර්තව්‍ය පහත සඳහන් පරිදි වේ.

1. (අ) රැකිරක්ෂා, පුහුණුව හා අධ්‍යාපනය
   (ආ) විද්‍යාව හා තාක්ෂණය උපයෝගී කර ගැනීම
   (ඇ) ජීවන තත්වය නංවාලීම
   (ඈ) අවාසිකර තැනැත්තන්ගේ කණ්ඩායම් සඳහා සමාජ ආරක්ෂාව සැලසුම් කිරීම සහ
   (ඉ) ආර්ථික ප්‍රතිසංස්කරණ මගින් හිමිකම් රැකදීම සම්බන්ධයෙන් වන හෝ අදාළ වන මානව සම්පත් ඛණ්ඩ පරිමේය කිරීම සහ සමෝධානය කිරීම ඇතුළුව, ජාතික මානව සම්පත් ප්‍රතිපත්තියේ සියලු අංශ වලින් අමාත්‍යවරයාට උපදෙස් දීම

2. ජාතික ප්‍රතිපත්තියට අනුකූල වූ මානව සම්පත් සංවර්ධනය කිරීමේ සැලසුම් හා වැඩසටහන් රජයට ඉදිරිපත් කිරීම සඳහා විෂයභාර අමාත්‍යවරයාට නිර්දේශ කිරීම.

3. ජාතික මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්තිය සහ ක්‍රියාත්මකව පවත්නා සැලසුම් සහ වැඩසටහන් කලින් කල සමාලෝචනය කිරීම හා පරීක්ෂා කර බැලීම සහ අවශ්‍ය වන විටක, ඒ ප්‍රතිපත්තියට සැලසුම්වලට හා වැඩසටහන්වලට කළයුතු වෙනස් කිරීම් අමාත්‍යවරයාට නිර්දේශ කිරීම.

4. ආණ්ඩුව විසින් අනුමත කරන ලද මානව සම්පත් සංවර්ධන සැලසුම් සහ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම ගැන සොයා බැලීම

5. මේ පනතේ උපලේඛනයේ සඳහන් කවර හෝ විෂයයන් හා සම්බන්ධ යම් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම. එසේ වුවද එම ව්‍යාපෘතිය වෙනත් යම් අමාත්‍යවරයෙකුට පවරා තිබෙන විෂයයන් හා සම්බන්ධ වන අවස්ථාවක, එය ක්‍රියාත්මක කිරීම, ඒ වෙනත් අමාත්‍යාවරයාගේ එකඟත්වය ඇතිව විය යුතුය සහ

6. ජාතික අරමුණුවලට අනුකූලව මානව සම්පත් සංවර්ධනය කිරීමට අවශ්‍ය යයි හෝ හිතකර යයි හෝ ආනුෂංගික යයි සභාව අදහස් කරන වෙනත් සියළු ක්‍රියා සිදු කිරීම

## 1.5 සභාව සතු බලතල

1997 අංක 18 දරණ මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභා පනතේ 16 (2) (1) වන උප වගන්තිය අනුව සභාව සතු බලතල මෙසේය.

අ) සභාවේ කර්තව්‍ය ඉටුකිරීම සඳහා අවශ්‍යවන සමීක්ෂණ, විමර්ශන, අධ්‍යයන සහ පර්යේෂණ කිරීමට.

(ආ) මානව සම්පත් සංවර්ධනයට අදාලව කරුණු සම්බන්ධයෙන් විශේෂඥයන්ගේ, වෘත්තීකයන්ගේ හෝ මහජනයාගේ මතය දැන ගැනීම සඳහා ප්‍රසිද්ධියේ හෝ පෞද්ගලිකව කරුණු විමසීමට.

(ඇ) සභාව විසින් ඉටුකරනු ලබන කර්තව්‍ය වලට සමාන කර්තව්‍ය ඉටු කරන ශ්‍රී ලංකාවෙන් බැහැර පිහිටි ජාත්‍යන්තර නියෝජ්‍යායතන සහ වෙනත් සංවිධාන සමඟ සම්බන්ධතා ඇතිකර පවත්වාගෙන යාමට.

(ඈ) මේ පනත යටතේ සභාවේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය වන සියළු කොන්ත්‍රාත්තුවලට සහ ගිවිසුම්වලට එළඹීමට සහ ඒවා ඉටු කිරීමට.

(ඉ) ශ්‍රී ලංකාවේ හෝ විදේශීය රටවල පිහිටි ආයතන හෝ පුද්ගලයින් මගින් මානව සම්පත් සංවර්ධන පර්යේෂණ පැවැත්වීම සඳහා කටයුතු වල යෙදීමට.

(ඊ) මානව සම්පත් සංවර්ධනය හා ඊට සම්බන්ධ ක්ෂේත්‍ර පිළිබඳව තොරතුරු දත්ත බැංකුවක් පිහිටුවා පවත්වාගෙන යාමට.

(උ) යම් බැංකුවක හෝ බැංකුවල ජංගම, ඉතිරිකිරීම් හෝ තැන්පතු ගිණුම් විවෘත කර පවත්වාගෙන යාමට.

(ඌ) චංචල සහ නිශ්චල යන දෙවර්ගයේම ආධාර හා පරිත්‍යාග පිළිගැනීමට සහ භාරගැනීමට.

(එ) මානව සම්පත් සංවර්ධනයේ විවිධ අංශවල නිපුණ විශේෂඥ සංචිතයක් සංවර්ධනය අරමුණු කර ගෙන සභාවේ නිළධරයන්ගේ දක්ෂතා වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට.

(ඒ) සභාවේ කර්තව්‍ය සාර්ථක ලෙස ඉටුකිරීම සඳහා අවශ්‍ය වන කමිටු විශේෂඥ කණ්ඩායම් සහ උපදේශක මණ්ඩල පත් කිරීමට.

(ඔ) අමාත්‍යාංශවලින්, ආණ්ඩුවේ දෙපාර්තමේන්තු වලින්, රාජ්‍ය සංස්ථාවලින්, ව්‍යවස්ථාපිත මණ්ඩලවලින්, පළාත් සභා වලින්, පළාත් පාලන ආයතනවලින් සහ පෞද්ගලික අංශයේ ආයතනවලින් ලබා ගන්නා සංඛ්‍යා ලේඛන ඇතුළුව සභාව විසින් අවශ්‍ය යැයි සලකනු ලබන තොරතුරු ඉල්ලා සිටීමට සහ ඒවා ලබා ගැනීමට.

(ඕ) සභාවේ කර්තව්‍ය බලතල සහ කාර්ය ඉටු කිරීම ක්‍රියාත්මක කිරීම සහ සිදු කිරීම සඳහා අවශ්‍ය යැයි හිතකර යැයි හෝ ආනුෂංගිකයයි සභාවේ මතය අනුව සභාව විසින් සලකනු ලබන සියළු පියවර ගැනීමට.

## 2. මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ සංවිධාන ව්‍යුහය

ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන මෙම සභාව 1997 අංක 18 දරණ මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභා පනතේ දැක්වෙන විධි විධාන අනුව පත් කරනු ලබන සභාපතිවරයෙකුගෙන් හා සාමාජිකයන් 20 දෙනෙකුගෙන් සමන්විත වේ. ඉන් 15 දෙනෙකු නිල බලයෙන් පත්වන අතර අදාල ආයතන වලින් 5 දෙනෙකු සාමාජිකයන් ලෙස පත්වනු ඇත. ඒ හැරුණු විට අදාල ක්ෂේත්‍රයන්හි පලපුරුද්ද හැකියාව යනාදිය සලකා 5 දෙනෙකු පත්කරනු ලබන අතර මින් දෙදෙනෙකු පුද්ගලික අංශයෙන් වේ. සභා සභිකයන් අතුරෙන් එක් අයෙකු විධායක සභාපති සේ නම් කිරීමට විෂයභාර ඇමතිතුමාට බලය පැවරේ. මෙහි ප්‍රධාන විධායක නිළධාරියා වනුයේ සභාවේ සභාපතිය. 2016.12.31 දින වනවිට සාමාජිකයන් 19 දෙනෙකුගෙන් සමන්විත විය. 2016.12.31 දිනට සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලය පහත සාමාජිකයන්ගෙන් සමන්විත විය.

**පනතේ 3(1) (අ) සිට (ව) දක්වා වගන්ති යටතේ කර ඇති පත්වීම්**

1. සභාපති, මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව
2. ලේකම්, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය
3. ලේකම්, උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශය
4. ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය
5. ලේකම්, විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය
6. ලේකම්, කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය
7. ලේකම්, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය
8. ලේකම්, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
9. ලේකම්, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය
10. ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය
11. සභාපති, තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
12. අධ්‍යක්ෂ ජෙනරාල්, තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
13. සභාපති, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
14. සභාපති, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
15. සභාපති, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය
16. ලේකම්, මුදල් අමාත්‍යාංශය

**පනතේ 3(2) (ජ) වගන්තිය යටතේ කර ඇති පත්වීම**

1. මහාචාර්ය කාමෙනා ගුණරත්න මිය - පීඨාධිපති, මානව හා සමාජ විද්‍යා පීඨය, විවෘත විශ්ව විද්‍යාලය
2. ආචාර්ය රංගික හල්වතුර මහතා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, මොරටුව විශ්ව විද්‍යාලය
3. වෛද්‍ය රනිල් අබේසිංහ මහතා - 178, ජෝර්ජ් ද සිල්වා මාවත, මහනුවර

**2016 වර්ෂයේ මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ පාලක මණ්ඩල රැස්වීම් පැවැත්වූ දිනයන් හා සහභාගී වූ සාමාජිකයන් පිලිබඳ විස්තර -**

| අනු අංකය | පාලක මණ්ඩල සාමාජිකයන් | 2016.03.02 | 2016.06.29 | 2016.10.28 |
|---|---|---|---|---|
| 01. | සභාපති, මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව | √ | √ | √ |
| 02. | ලේකම්, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය | - | √ | √ |
| 03. | ලේකම්, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය | - | √ | √ |
| 04. | ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය | - | - | - |
| 05. | ලේකම්, විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය | - | - | - |
| 06. | ලේකම්, කම්කරු සහ වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය | - | √ | √ |
| 07. | ලේකම්, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය | √ | - | √ |
| 08. | ලේකම්, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | - | - | √ |
| 09. | ලේකම්, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය | - | √ | - |
| 10. | ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය | - | - | - |
| 11. | සභාපති, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව | - | - | √ |
| 12. | අධ්‍යක්ෂ ජෙනරාල්, තෘතියීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව | - | √ | - |
| 13. | සභාපති, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව | √ | - | √ |
| 14. | සභාපති, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | √ | - | - |
| 15. | සභාපති, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය | - | - | - |
| 16. | නියෝජිත, මුදල් අමාත්‍යාංශය | √ | - | - |
| 17. | මහාචාර්ය කාමෙනා ගුණරත්න (පත්කල සාමාජික) | - | - | √ |
| 18. | වෛද්‍ය රනිල් අබේසිංහ (පත්කල සාමාජික) | √ | - | √ |
| 19. | ආචාර්ය රංගික හල්වතුර (පත්කල සාමාජික) | √ | √ | √ |
| | **සහභාගි වූ මුළු ගණන** | **07** | **07** | **11** |

**2016 වර්ෂය තුළ සභාවේ සමාජිකයින්ගේ සිදු වූ වෙනස්කම්**

1. අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් කටයුතු කල ඩබ්.එම්. බන්දුසේන මහතා විශ්‍රාම යාමෙන් අනතුරුව සුනිල් හෙට්ටිආරච්චි මහතා ලේකම් වශයෙන් පත් වූ අතර 2016.09.22 දින සිට පාලක මණ්ඩල සාමාජිකයකු වශයෙන් පත් කර ඇත.


2. රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් කටයුතු කල ජේ. දඩල්ලගේ මහතා විශ්‍රාම යාමෙන් අනතුරුව ජේ.ජේ. රත්නසිරි මහතා ලේකම් වශයෙන් පත් වී ඇති අතර 2016.09.22 දින සිට පාලක මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් පත් කර ඇත.

3. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියේ සභාපති වශයෙන් කටයුතු කල ජේ.වයි. පීරිස් මහතා වෙනුවට එම ආයතනයේ නව සභාපති ආචාර්ය ඒ.යූ.සී. අතුකෝරල මහතා 2016.09.22 දින සිට පාලක මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් පත් කර ඇත.

4. 1997 අංක 18 දරණ මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභා පනතේ 3(1)*P* වගන්තිය යටතේ ආචාර්ය චන්ද්‍රා ඇඹුල්දෙණිය මහතා 2016.10.31 දින සිට පාලක මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් පත් කර ඇත.

5. මුදල් අමාත්‍යාංශයේ නියෝජිත ලෙස කටයුතු කල එන්. ගොඩකන්ද මහත්මිය වෙනත් අමාත්‍යාංශයක් වෙත ස්ථාන මාරු ලබා ගොස් ඇත.

## 3.මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ සංවිධාන සටහන



**4.**මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ සේවය කරන ලද සේවක ලැයිස්තුව හා ඔවුන්ගේ තනතුරු

| තනතුරු නාමය | අනුමත සේවක සංඛ්‍යාව | **2016.12.31** දිනට සේවයේ යෙදී සිටින සංඛ්‍යාව | **2016.12.31** දිනට පුරප්පාඩු සංඛ්‍යාව | නම |
|---|---|---|---|---|
| සභාපති | 01 | 01 | - | දිනේෂ් වීරක්කොඩි මහතා |
| අධ්‍යක්ෂ | 01 | 01 | - | කේ.ඒ ලලිතධීර මහතා |
| සහකාර අධ්‍යක්ෂ | 03 | 02 | 01 | ජේ.ඒ.සී.පී. ජයසිංහ මිය<br>එස්. තනගසීලන් මහතා |
| සභා ලේකම්/නීති නිලධාරි | 01 | 01 | - | ජී.ජී. කසුනි උත්පලා මෙනවිය |
| පර්යේෂණ නිලධාරි | 04 | 04 | - | ආර්.එම්.ඒ. යූ.කේ. රත්නායක මිය<br>එම්.ඒ.එච්.ඩී.සී පෙරේරා මිය<br>ඩී.සෙන්තිල්නාදන් මහතා<br>එන්.ඩී එදිරිසිංහ මෙනවිය |
| පරිපාලන නිලධාරි | 01 | 01 | - | කේ.වී.එස්. එරංගා මෙනවිය |
| භාෂා පරිවර්තක | 01 | - | 01 | - |
| සංවර්ධන නිලධාරි | 04 | 04 | - | පී.ඊ.එස්. ද සිල්වා මිය<br>ආර්.ඩී.සී.එස්. රාජපක්ෂ මහතා<br>කේ.පී.පී. පෙරේරා මහතා<br>කේ.සී ගුරුසිංහ මිය |
| සභාපතිගේ පෞද්ගලික සහකාර | 01 | - | 01 | - |
| කළමනාකරණ සහකාර | 08 | 07 | 01 | සී.ආර්. මද්දගේ මහතා<br>එම්.ජී.එන්. දිල්හාරි මෙනවිය<br>ඩබ්.එම්. ලක්ෂිත රජිත් මහතා<br>කේ.සී මුතුමාල මෙනවිය<br>ආශා සුරේනි එදිරිසිංහ මෙනවිය<br>ජී.එම් සද්ධාමංගල මිය<br>ආර්.එල්.අයි සංජීවනී මෙනවිය |
| රියැදුරු | 04 | 03 | 01 | ජී.එම්. පින්නදූව මහතා<br>ටෙරන්ස් පියල් මහතා<br>අසංක ලක්මාල් මහතා |
| කාර්යාල සහායක | 04 | 03 | 01 | එන්.ජී. නදුන් මධුරංග මහතා<br>ඩබ්.ආර්.ඒ. ප්‍රින්ස් ග්‍රැන්විල් මහතා<br>ඒ. නයනා ප්‍රියදර්ශනී මෙනවිය |
| **මුළු එකතුව** | **33** | **27** | **06** | |

**නව බඳවා ගැනීම්**

| නම | තනතුර | බඳවාගත් දිනය |
|---|---|---|
| කේ.වී.එස් එරංගා මෙනවිය | පරිපාලන නිලධාරි | 2016/08/15 |
| ආර්.එල්.අයි සංජීවනී මෙනවිය | කළමනාකරණ සහකාර | 2016/10/17 |
| ඩී.එච්.ඩබ්. අසංක ලක්මාල් මහතා | රියැදුරු | 2016/08/01 |

**අනුයුක්ත කිරීම**

| නම | තනතුර | අනුයුක්ත ආයතනය | අනුයුක්ත කල දිනය |
|---|---|---|---|
| එච්.යූ කාරියවසම් මහතා | සහකාර අධ්‍යක්ෂ ( මූල්‍ය) | ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය | 2016/10/16 |

**සේවයෙන් ඉල්ලා අස්වීම්**

| නම | තනතුර | ඉල්ලා අස්වූ දිනය |
|---|---|---|
| චාමිනී කාරියවසම් මිය | පරිපාලන නිලධාරි ( කා/පැ) | 2016/01/14 |
| ඩබ්.එච්.ඊ ජයරත්න මහතා | රියැදුරු | 2016/05/27 |
| යූ.එස්.ටී. විතානගේ මයා | සහකාර අධ්‍යක්ෂ(මූල්‍ය) | 2016/10/04 |

**දේශීය පුහුණුවීම් - තනි පුද්ගල/කණ්ඩායම්**

**තනි පුද්ගල පුහුණුවීම්**

| අංකය | සේවකයාගේ නම | තනතුර | වැඩසටහනේ නම | ආයතනය |
|---|---|---|---|---|
| 1 | කසුනි මුතුමාල මෙනවිය | කළමනාකරණ සහකාර | පරිසණකගත ගිණුම්කරණය[SME] [Qickbooks, Tally ERP, MYOB] | AAT ආයතනය |
| | නදීෂා දිල්හාරි මෙනවිය | කළමනාකරණ සහකාර | | |
| 2 | කසුනි මුතුමාල මෙනවිය | කළමනාකරණ සහකාර | ලංසු ඇගයීම | නිපුණතා සංවර්ධන අරමුදල |
| | නදීෂා දිල්හාරි මෙනවිය | කළමනාකරණ සහකාර | | |
| | එම්. සද්ධාමංගල මිය | කළමනාකරණ සහකාර | | |
| 3 | එම්. සද්ධාමංගල මිය | කළමනාකරණ සහකාර | Microsoft Excel 2010/2013 Master Course for HR Professionals | IPM |
| 4 | ජී.ජී.කසුනි උත්පලා මෙනවිය | සභා ලේකම්/ නීති නිලධාරි | වෘත්තීය සංවර්ධනය සඳහා කම්කරු නීතිය ( Labour Law for Career Development) | IPM |
| 5 | කේ.ඒ ලලිතධිර මහතා | අධ්‍යක්ෂ | වෘත්තිකයන් සඳහා ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව | NIBM |
| 6 | ලක්ෂිත රජිත් මයා | කළමනාකරණ සහකාර | කථන ඉංග්‍රීසි පාඨමාලාව | ICBT |
| 7 | අමාලි රත්නායක මිය | පර්යේෂණ නිලධාරි | නියාමන හා ඇගයීම් ඩිප්ලෝමා පාඨමාලාව(Diploma in Monitoring and Evaluation) | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය |

**කණ්ඩායම් පුහුණුවීම්**

| අංකය | සේවකයාගේ නම | තනතුර | වැඩසටහනේ නම | ආයතනය |
|---|---|---|---|---|
| 1 | සෙව්වන්දි එරංගා මිය | පරිපාලන නිලධාරි | මානව ප්‍රාග්ධන සංවර්ධන පාඨමාලාව | හැටන් නැෂනල් බැංකුව |
| | රජිත මද්දගේ මයා<br>ලක්ෂිත රජිත් මයා<br>නදීෂා දිල්හාරි මෙනවිය<br>එම්. සද්ධාමංගල මිය<br>ආශා සුරේනි මෙනවිය<br>කසුනි චමලිකා මෙනවිය<br>ඉනෝකා සංජීවනී මිය | කළමනාකරණ සහකාර | | |
| 2 | කේ.ඒ ලලිතධීර මයා | අධ්‍යක්ෂ | ක්‍රියාකාරී සැලසුම් දියුණුකිරීම පිළිබඳ පුහුණු වැඩසටහන | මා.ස.සං.ජා.ස. |
| | ජේ.ඒ.සී.පී. ජයසිංහ මිය<br>යූ.එස්.ටී. විතානගේ මයා<br>එස්.ටී.සීලන් මයා<br>ජී.ජී.කේ.උත්පලා මෙනවිය | සහකාර අධ්‍යක්ෂ<br>සහකාර අධ්‍යක්ෂ<br>සහකාර අධ්‍යක්ෂ<br>නීති නිලධාරි | | |
| | හංසනී පෙරේරා මිය<br>ඩී.සෙන්තිල්නාතන් මයා<br>අමාලි රත්නායක මිය<br>එන්.ඩී.එදිරිසිංහ මිය | පර්යේෂණ නිලධාරි | | |
| | කේ.ප්‍රභාත් පෙරේරා මයා<br>ආර්.ඩී.සී.එස් රාජපක්ෂ මයා<br>එරන්දි ද සිල්වා මිය<br>ජී.කසුන්දනී චතුරිකා මිය | සංවර්ධන නිලධාරි | | |
| | ජී.පී.එම්.සද්ධාමංගල මිය | කළමනාකරණ සහකාර | | |
| 3 | එස්.තනිගසීලන් මයා<br>කේ.වී සෙව්වන්දි මෙනවිය<br>එන්.ඩී.එදිරිසිංහ මිය<br>ඩී.සෙන්තිල්නාතන් මයා | සහකාර අධ්‍යක්ෂ<br>පරිපාලන නිලධාරි<br>පර්යේෂණ නිලධාරි<br>පර්යේෂණ නිලධාරි | වාර්තා ලේඛනය පිළිබඳ පුහුණු වැඩසටහන | මා.ස.සං.ජා.ස. |
| 4 | එස්.ටී. සීලන් මයා<br>ඩී.සෙන්තිල්නාතන් මයා<br>එරන්දි ද සිල්වා මිය<br>එම්.සද්ධාමංගල මිය | සහකාර අධ්‍යක්ෂ<br>පර්යේෂණ නිලධාරි<br>සංවර්ධන නිලධාරි<br>කළමනාකරණ සහකාර | මූල්‍ය රෙගුලාසි පිළිබඳ පුහුණු වැඩසටහන | මා.ස.සං.ජා.ස. |

# 5. ව්‍යාපෘති සහ වැඩසටහන්

## 5.1 කළමනාකරණ නිපුණතා සංවර්ධන වැඩසටහන 2016 (MCDP)

ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාව (NHRDC) රටේ මානව සම්පත් සංවර්ධනය උදෙසා වන ප්‍රතිපත්ති නිර්දේශ කිරීම සහ පාලනය සම්බන්ධයෙන් වගකීම් දරණ ශීඝ්‍රයෙන් වර්ධනය වන ආයතනයකි.

"අපගේ අනාගත සඳහා සූදානම් ශ්‍රම බලකායක්" යන මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාවේ දැක්ම යටතේ මැලේසියාවේ පුත්‍රා විශ්ව විද්‍යාලය සමඟ ඒකාබද්ධව රාජ්‍ය අංශයේ කළමනාකරණ කාර්ය මණ්ඩලය සඳහා කළමණාකරණ නිපුණතා සංවර්ධන වැඩසටහන් දෙකක් සාර්ථකව පවත්වන ලද අතර, පිළිවෙලින් පළමු වැඩසටහන 2016 අප්‍රේල් මාසයේද දෙවන වැඩසටහන 2016 ඔක්තෝබර් මාසයේද පවත්වන ලදී.

මෙම වැඩසටහන්වල ප්‍රධාන අරමුණ වනුයේ රාජ්‍ය අංශයේ කළමනාකරණ කාර්ය මණ්ඩලයන්හි නිපුණතාවයන් ශක්තිමත් කිරීමයි. මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වැඩසටහන් දේශීය සැසි සහ විදේශ සැසිවාරයන් ලෙස කොටස් දෙකකට වෙන් කරන ලද අතර, එක් එක් සැසිය විවිධ ආයතනවල කළමනාකරණ කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය වූ විවිධ හැකියාවන් ඉලක්ක කරගෙන සිදු කරන ලදී.

**දේශීය සැසිය**

| | |
|---|---|
| සම්පත් දායක | රනිල් සුගතදාස මයා |
| ස්ථානය | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය |
| විෂයය ක්ෂේත්‍ර | ➢ ව්‍යාපෘති කලමනාකරණය<br>➢ ව්‍යාපෘති කලමනාකරණය සම්බන්ධ පරිගණක යෙදුම් (MS ව්‍යාපෘති මෘදුකාංග)<br>➢ කාල කළමනාකරණය<br>➢ පිරිවැය කළමනාකරණය<br>➢ සම්පත් කළමනාකරණය<br>➢ ඉදිරිපත් කිරීමේ කුසලතා |

**විදේශීය සැසිය**

| | |
|---|---|
| ස්ථානය | පුත්‍රා විශ්ව විද්‍යාලය, මැලේසියාව |
| විෂයය ක්ෂේත්‍ර | ➢ පිටස්තර පුහුණුව (Out bound) පුහුණුව හරහා අභිප්‍රේරණය සහ කණ්ඩායම් නිර්මාණය<br>➢ ජාත්‍යන්තර කතිකා<br>➢ මානව සම්පත් කළමනාකරණය<br>➢ රාජ්‍ය අංශයෙහි උපායමාර්ගික නායකත්වය<br>➢ මැලේසියාවෙහි පරිණාමන නායකත්වය<br>➢ උපායමාර්ගික කළමනාකරණය |

සහභාගිවූවන්ගේ විස්තර පහත පරිදි වේ:

**MCDP 01**

| | නම | තනතුර | ආයතනයේ නම |
|---|---|---|---|
| 1 | එම්.ඒ.එල්.කේ.මන්ත්‍රීරත්න මහතා | සහකාර ලේකම් | අධිකරණ අමාත්‍යාංශය |
| 2 | එම්.එල්.එම්.කුසුම්පාල මහතා | කම්කරු නිලධාරි II | කම්කරු දෙපාර්තමේන්තුව |
| 3 | පී.ඒ.එම්.ආර්.චන්ද්‍රසේකර මෙය | සහකාර අධ්‍යක්ෂ (පරිපාලන සහ මූල්‍ය) | ජාතික යොවුන් සේනාංකය |
| 4 | ආර්.එම්.ඒ.කේ.විජේරත්න මයා | සහකාර අධ්‍යක්ෂ -මධ්‍යම පළාත | ජාතික යොවුන් සේනාංකය |
| 5 | මේජර් ජී.එම්. යූ. බණ්ඩාරනායක මයා | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය භාර නිලධාරි | ජාතික යොවුන් සේනාංකය,වාරියපොල |
| 6 | එල්.එච්.පී.සන්දනාත් මයා | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය භාර නිලධාරි | ජාතික යොවුන් සේනාංකය, දොඩම්ගස්ලන්ද |
| 7 | ඩබ්.එම්.රත්නසිරි මයා | කලමණාකාර (ප්‍රතිලාභ පරිපාලන) | සේවක භාරකාර අරමුදල් මණ්ඩලය |
| 8 | එච්.ජී.ජී.ජේ. ධර්මසේන මයා | අධ්‍යක්ෂ ජනරාල් | මිනිස්බල සහ රැකී රක්ෂා දෙපාර්තමේන්තුව |

| | | | |
|---|---|---|---|
| 9 | ආර්.එම්.ටී.වී.රාජගුරු මෙය | සහකාර ලේකම් (පරිපාලන) | කම්කරු සහ වෘත්තීය සමිති සබඳතා අමාත්‍යංශය |
| 10 | ආර්.ආර්.කේ. නුගපිටිය මයා | අධ්‍යක්ෂක | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව |
| 11 | එස්.එම්.දයාරත්න මයා | අධ්‍යක්ෂක | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව |
| 12 | එම්.ඒ.කේ.පී.විජේවන්ත මෙය | අධ්‍යක්ෂක | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව |
| 13 | අයි.ඒ.මාලිකා ප්‍රනාන්දු මෙය | අධ්‍යක්ෂක (ICT) | ජනසංගණන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව |
| 14 | සී.ගුණවර්ධන මෙය | සහකාර ලේකම් | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම |
| 15 | කේ.ඒ. ලලිතධීර මයා | අධ්‍යක්ෂක | මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව |
| 16 | ආර්.ඩී.සී.එස්.රාජපක්ෂ මයා | සංවර්ධන නිලධාරි | මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව |
| 17 | ආර්.එම්.ඒ.යූ.කේ.රත්නායක මිය | පර්යේෂණ නිලධාරි | මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව |
| 18 | ආර්.එම්.ඩී. කුඩගම්මන මයා | ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු | ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව |
| 19 | වී.පී.සමරවීර මයා | ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු | ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව |
| 20 | එස්. ෂියා ඩෙවි මෙය | ඉංජිනේරු | ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව |
| 21 | ඩබ්.පී.සී.ඩබ්. තිලකරත්න මයා | ඉංජිනේරු | ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව |
| 22 | වයි.පී.සී. ද සිල්වා මයා | නියෝජ්‍ය සාමාන්‍ය අධිකාරි ඉදිකිරීම් | ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව |
| 23 | ඕ.ඩී.ඩබ්.ආර්. ගුණතිලකරත්න මයා | සහකාර සාමාන්‍ය අධිකාරි ඉදිකිරීම් | ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව |
| 24 | ජයංගනී නදීෂා සමරසිංහ මෙය | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම |
| 25 | මනෝහරන් සතීෂ් මයා | සහකාර ලේඛකාධිකාරි | ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලය |

2016 ඔක්තෝබර් මාසයේ දී පවත්වන ලද දෙවන MCDP වැඩසටහනේදී මෙම වැඩසටහනේ සහභාගීවූවන්ට සිංගප්පූරුව වෙත එක් දින සංචාරයකට හිමිකම ලැබූ බැවින් එය විශේෂ අවස්ථාවක් විය. සහභාගීවූවන්ගේ විස්තර පහත සඳහන් පරිදි වේ.

## MCDP 02

| අංකය | නම | තනතුර | ආයතනයේ නම |
|---|---|---|---|
| 1 | එම්.කේ.ජී.අයි.කීර්තිලතා මිය | මෙහෙයුම් කළමනාකාර - WPN | ලංකා බැංකුව |
| 2 | ජී.කේ.රන්මන්දල මිය | ප්‍රධාන කළමනාකාර | ලංකා බැංකුව |
| 3 | යූ.එන්. හේරත්රන්දෙනි මිය | සම්බන්ධතා කළමනාකරු (විදේශ බැංකුකරණය) | ලංකා බැංකුව |
| 4 | ආර්.එම්.බී.එම්. රත්නායක මයා | ජ්‍යෙෂ්ඨ කළමනාකාර | ලංකා බැංකුව |
| 5 | වී.සිවනාන්තන් මයා | ජ්‍යෙෂ්ඨ කළමනාකාර | ලංකා බැංකුව |
| 6 | පී.ඩබ්.එම්.කේ. තිලකරත්න මයා | ජ්‍යෙෂ්ඨ කළමනාකාර | ලංකා බැංකුව |
| 7 | එන්.දියබෙදනගේ මිය | අධ්‍යක්ෂ ජනරාල් | වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය |
| 8 | ඩී.කේ.ඩී.ජී.ලක්මාලි මෙය | ප්‍රධාන ගණකාධිකාරි | කම්කරු දෙපාර්තමේන්තුව |
| 9 | ඒ.ආර්.හේවාපතිරණ මයා | සහකාර කම්කරු කොමසාරිස් | කම්කරු දෙපාර්තමේන්තුව |
| 10 | එන්.පී.මානගේ මෙය | සහකාර කම්කරු කොමසාරිස් | කම්කරු දෙපාර්තමේන්තුව |
| 11 | එම්.කේ. උපුල් සෙනරත් මයා | කම්කරු නිලධාරි | කම්කරු දෙපාර්තමේන්තුව |
| 12 | ඒ.එස්.බී. විජේසූරිය මයා | ඉංජිනේරු | කම්කරු දෙපාර්තමේන්තුව |
| 13 | ඩී.අයි.අයි.පෙරේරා මිය | අධ්‍යක්ෂ- පරිපාලන | මාර්ග සංවර්ධන අධිකාරිය |
| 14 | ජී.ඩී.එස්. කුමාරසිංහ මයා | නියෝජ්‍ය සාමාන්‍ය කළමනාකාර - මූල්‍ය | රාජ්‍ය දැව සංස්ථාව |
| 15 | එස්. චන්තිර මිය | අධ්‍යක්ෂ (සැලසුම්) | අධිකරණ අමාත්‍යංශය |
| 16 | බී.ඒ.පී.එස්. බාලසූරිය මිය | නියෝජ්‍ය සාමාන්‍ය කළමනාකාර - නීති සහ මණ්ඩල ලේකම් | ජාතික ලොතරැයි මණ්ඩලය |
| 17 | එම්.ජී.කේ.එම්. මදාලුස්ස මිය | සහකාර නියෝජ්‍ය කළමනාකාර (මූල්‍ය) | ජාතික ලොතරැයි මණ්ඩලය |
| 18 | එච්.එම්.සී.එන්. හේරත් මිය | නියෝජ්‍ය සාමාන්‍ය කළමනාකාර (පරිපාලන) | ජාතික ලොතරැයි මණ්ඩලය |
| 19 | ඩී.ඩී.ජේ. වානගුරු මෙය | වැඩසටහන් නිලධාරි | සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල |
| 20 | කේ.අයි.පෙරේරා මෙය | වැඩසටහන් නිලධාරි | සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල |
| 21 | ඊ.එම්.එස්.කේ.ඊ. මූනමලේ මිය | ලේකම්/සභාපතිගේ පෞද්ගලික ලේකම් | වෘත්තීය පුහුණු අධිකාරිය |
| 22 | එම්.ඩී.ඒ.නිලන්ති මිය | ලේකම්/අධ්‍යක්ෂගේ පෞද්ගලික සහකාර | වෘත්තීය පුහුණු අධිකාරිය |
| 23 | යූ.ජී.රත්නසිරි මයා | අතිරේක ලේකම් | ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යංශය |
| 24 | ඩබ්.පී.ටී.එන්.ෆොන්සේකා මිය | කළමනාකරණ සහකාර | ශ්‍රී ලංකා මහ බැංකුව |
| 25 | බී.ජී.ඒ.එල්. බාලසූරිය මිය | තොරතුරු තාක්ෂණ ශිල්පී | ශ්‍රී ලංකා මහ බැංකුව |
| 26 | කේ.එම්.එස්.සංජීව මයා | කළමනාකරණ සහකාර | ශ්‍රී ලංකා මහ බැංකුව |
| 27 | එම්.එම්.එලිපිටිය මිය | කළමනාකරණ සහකාර | ශ්‍රී ලංකා මහ බැංකුව |
| 28 | එස්. තනිගසීලන් මයා | සහකාර අධ්‍යක්ෂ | මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාව |

**මතක සටහන් -** MCDP 01






**මතක සටහන් -** MCDP 02






## 5.2 ශ්‍රී ලාංකීය මානව ප්‍රාග්ධන සමුළුව 2016

**අරමුණ:**

ශ්‍රී ලංකාවේ වර්ධන අංශයට සහාය දැක්වීම සඳහා ජාතික න්‍යාය පත්‍රයක් සැකසීම අරමුණු කරගත් මානව ප්‍රාග්ධන අවස්ථා සාකච්ඡාවට ලක් කිරීම

**ජයග්‍රහණ:**

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව සහ ශ්‍රී ලංකා මානව සම්පත් කළමණාකරණ සංගමය (AHRP) විසින් අගෝස්තු මස 11 සිට 12 දක්වා ශ්‍රී ලංකා මානව ප්‍රාග්ධන සමුළුව - 2016 සංවිධානය කරන ලදී. මානව සම්පත් අභියෝගයන් සඳහා විසඳුම් සොයා ගැනීම සහ තරඟකාරී මායිමක් ගොඩනැංවීම පිණිස ශ්‍රී ලංකාවට සහාය දැක්වීම පිණිස ඒකරාශී වූ ලංකා සේවාදායකයින්ගේ සංගමය, අන්තර් ජාතික කම්කරු සංගමය, ආසියානු සංවර්ධන බැංකුව, සහ ලෝක බැංකුව වැනි නානාවිධ පාර්ශවකරුවන් සහ සහායක හවුල්කරුවන් විසින් සම්මේලනය වඩාත් සාර්ථකත්වයට පත් කරන ලදී.

මෙම සමුළුවේ ප්‍රධාන ලක්ෂණයක් වූයේ නව ආර්ථික සංවර්ධන සැලැස්මේ කොටසක් ලෙස මානව සම්පත් ප්‍රතිපත්තිය නැවත සකස් කිරීම පිණිස රජයට සහයෝගය දැක්වීම සඳහා මානව ප්‍රාග්ධන සංවර්ධන ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගෙන් ආදානයන් ලබාගැනීමයි.

ශ්‍රී ලංකාව තුළ ප්‍රධාන වර්ධන ක්ෂේත්‍ර පිළිබඳව සමුළුව අවධානය යොමු කර ඇති අතර, සංචාරක හා සත්කාරක, සේවා, නිෂ්පාදන හා ඉදිකිරීම් සහ විදේශ රැකියා යන එම අංශ හතරෙහි පවතින අවස්ථාවන් ඉස්මතු කර තිබේ.





## 5.3 සංචාරක සහ ආගන්තුක සත්කාරය පිළිබඳ වැඩමුළුවක් පැවැත්වීම මගින් කලාපය තුළ රැකියා අවස්ථා පිළිබඳ දැනුවත් කිරීම.

**අරමුණ:**

මෙම වැඩසටහනේ පරමාර්ථය වන්නේ, තෝරාගත් දිස්ත්‍රික්කවල පාසල් හැර යන ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා සංචාරක හා රැකියා අවස්ථා අධ්‍යයනය කිරීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශවල සහභාගිත්වය ඇතිව සෘජු හා වක්‍ර ආකාරයන්ගෙන් තරුණ තරුණියන් අතර උනන්දුව ඇති කිරීම සහ වෘත්තීය පුහුණු ආයතන (SLITHM, VTA, NAITA, UNIVOTEC, SLIATE, EUSL, HEMAS, MSU & MSI, CAHM සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල) සඳහා බඳවා ගන්නා සිසුන් ප්‍රමාණය ඉහළ නැංවීමට සහාය දැක්වීමයි. මෙම වැඩමුළුව මගින් පාසැල් හැරගිය සිසුන් 1817 ක් දැනුවත් කරන ලදී.

**වැඩසටහනේ හවුල්කරුවන්:**

**SLITHM** - ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය

**CMA** - ශ්‍රී ලංකා වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය

**CAHM** - කොළඹ සත්කාරක කළමනාකරණ ඇකඩමිය

**VTA** - වෘත්තීය පුහුණු අධිකාරිය

**NAITA** - ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය

**UNIVOTEC** - වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය

**SLIATE** - ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය

**EUSL** - ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලය

**MSU** - කළමනාකරණ හා විද්‍යා විශ්ව විද්‍යාලය

| අංකය | දිස්ත්‍රික්කය | පැවැත් වූ දිනය | මුළු ප්‍රතිලාභීන් |
|---|---|---|---|
| 1 | මඩකලපුව | 2016.03.29 | 372 |
| 2 | ගාල්ල | 2016.06.09 | 170 |
| 3 | කළුතර | 2016.07.29 | 370 |
| 4 | පොළොන්නරුව | 2016.09.27 | 350 |
| 5 | පුත්තලම | 2016.11.17 | 320 |
| 6 | බදුල්ල | 2016.12.23 | 235 |
| | **එකතුව** | | **1817** |

**ජනතාව සවිබලගැන්වීම :**

ඉහත සඳහන් හවුල්කරුවන් සමඟින් රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සහයෝගය ඇතිව සංචාරක අංශයට කුසලතා සැපයුමක් සහතික කිරීම හා සමගාමීව ඒ සඳහා පාසැල් හැරගිය සිසුන් පොළඹවා ගැනීම සහ වැඩිකරලීම සඳහා මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාව සංචාරක කර්මාන්තය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩ සටහනක් පවත්වන ලදී.

මෙම දැනුවත් කිරීමේ වැඩසටහන්වල අවසන් අරමුණ වනුයේ පාසැල් හැරගිය සිසුන්ව අදාළ පුහුණු පාඨමාලා හැදෑරීමට පෙළඹවීම සහ ඒ තුළින් රැකියා වියුක්ති අනුපාතය අඩු කිරීමට සහ දිගු කාලීනව මෙම කර්මාන්තවල නිපුණතා හිඟය සඳහා විසඳුමක් ලබා දීමයි.

තවද, මෙම අංශය තුළ කාන්තා සහභාගීත්ව හිඟය සපුරා ගැනීම සඳහා ඉලක්ක කරගත් මෙම දැනුවත් කිරීමේ වැඩසටහන තුළින් කාන්තාවන් පාර්ශවය බල ගැන්වීම සඳහා විශේෂයෙන්ම අවධානය යොමු කරන ලදී.

**1. දැනුවත් කිරීමේ වැඩසටහන් වල ඡායාරූප**

**පොළොන්නරුව දිස්ත්‍රික් දැනුවත් කිරීමේ වැඩමුළුව**






**ගාල්ල දිස්ත්‍රික් දැනුවත් කිරීමේ වැඩමුළුව**





## කළුතර දිස්ත්‍රික් දැනුවත් කිරීමේ වැඩමුළුව





## බදුල්ල දිස්ත්‍රික් දැනුවත් කිරීමේ වැඩමුළුව






## මඩකලපු දිස්ත්‍රික් දැනුවත් කිරීමේ වැඩමුළුව



## පුත්තලම දිස්ත්‍රික් දැනුවත් කිරීමේ වැඩමුළුව



## 5.4 හඳුනාගත් හවුල්කරුවන් සමඟ ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ක්ෂේත්‍රයේ ව්‍යාපාර හැකියාවන් ප්‍රවර්ධනය සහ ශක්තිමත් කිරීම

**අරමුණ:** කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයන්ව සවිබල ගැන්වීම සහ ශක්තිමත් කිරීම.

**ප්‍රතිදානය :** කොට්ඨාශ 6ක කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාවසායකයින් 529 ක් පුහුණු කර ඇත.

- අදාල පාර්ශ්වකරුවන් සමඟ ජාලයන් නිර්මාණය කිරීම (හැටන් නැෂනල් බැංකුව, ලංකා වාණිජ මණ්ඩලය, කාන්තා කටයුතු අමාත්‍යාංශය, දිස්ත්‍රික් සුළු හා මධ්‍ය පරිමාණ අංශය, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල)

| අංකය | දිස්ත්‍රික්කය | දිනය | පුරුෂ | ස්ත්‍රී | එකතුව |
|---|---|---|---|---|---|
| 1 | ගම්පහ | 2016.02.24 | 51 | 65 | 116 |
| 2 | බියගම | 2016.03.17 | 08 | 52 | 60 |
| 3 | හොරණ | 2016.05.19. | 26 | 77 | 103 |
| 4 | වත්තල | 2016.07.21 | 15 | 80 | 95 |
| 5 | කළුතර | 2016.09. 21 | 32 | 03 | 35 |
| 6 | බදුල්ල | 2016.12.23 | 21 | 99 | 120 |
| | **එකතුව** | | **153** | **376** | **529** |

**ජනතා බලගැන්වීම :**

මෙම ව්‍යවසායකයින් ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමින් විවිධ ව්‍යාපාරවල නිරත වන අතර කර්මාන්ත නිෂ්පාදන (ගඩොල්, වඩු කර්මාන්තය, කුළුබඩු නිෂ්පාදන, ඇඳුම් මැසීම, ඉදිකිරීම්), සේවා (කොණ්ඩා මෝස්තර සැකසුම් මධ්‍යස්ථාන, ගරාජ, කාර්මිකයින්, කම්මල්, තොග සහ සිල්ලර වෙළඳාම, උකස් මධ්‍යස්ථාන, පැස්සීම්, ජ්‍යොතිෂ්‍ය, ආපනශාලා, නිවාස හා මෝටර් රථ අලෙවිය, කුලී රථ සේවාව) සහ කෘෂිකර්මය (පශු සම්පත්, වැවිලි, උද්‍යාන විද්‍යාව) ඇතුළත්ව ස්වයං සේවා ව්‍යාපෘතිවල නියැලී සිටිති. පුහුණු වැඩසටහන අවසානයේ සහභාගී වූවන්ට සහතික පත් බෙදා දෙන ලදී.

පොදු වශයෙන්, තෝරාගත් දිස්ත්‍රික්ක සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් (SMEs) සම්බන්ධයෙන් සකස් කරන ලද නිසි දත්තයන් හෝ ආකෘතියක් නොතිබිණි. එමෙන්ම, කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර හිමියන්ට ග්‍රාමීය ප්‍රදේශවල අදාළ පාර්ශවකරුවන් හා සේවා සපයන්නන් සමඟ නිසි ජාලයක් තවමත් නිර්මාණය වී නොමැත. තවද, මූල්‍ය කළමනාකරණය, සේවා ලබා ගැනීමේ ප්‍රවේශය, අනෙකුත් ආයතන සමඟ ජාලගත කිරීම, ස්වකීය නිෂ්පාදන අලෙවිකරණය හා ප්‍රවර්ධනය කිරීම සහ තාක්ෂණික වැඩිදියුණු කිරීම් සමඟින් නිපුණතා සංවර්ධනය කිරීම වැනි අභියෝග රැසකට ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර මුහුණ දෙති.

ඉහත සඳහන් බාධක ජය ගැනීම සඳහා මෙම පුහුණු වැඩසටහන සඳහා පදනමක් සපයයි. නොගැලපෙන මූල්‍ය කළමනාකරණය නිසා බොහෝ ව්‍යාවසායකයින් අසාර්ථක වී ඇත. ශ්‍රී ලංකාවේ ව්‍යාපාරවල අසාර්ථකත්වය සඳහා ප්‍රධානතම හේතුව වන්නේ මෙයයි. පුහුණුව සඳහා සහභාගි වූ බොහෝ ව්‍යවසායකයින් පවසා ඇත්තේ තම ව්‍යාපාර කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කිරීම සඳහා මෙම පුහුණුව මඟින් දැවැන්ත පිටුවහලක් ලැබෙන බවය. මෙම වැඩසටහන මූල්‍ය පාලනය, බදු කළමනාකරණය හා නෛතික ගැටළු හරහා ව්‍යාපාර ප්‍රවර්ධනය ඉලක්ක කර ගත්තකි. මීට අමතරව, පුහුණු වැඩසටහන පැවැත්වීමේදී වෙළඳපල අවස්ථා සොයා ගැනීම සහ ඊට අදාළ විවිධාකාර කරුණු සැළකිල්ලට ගන්නා ලදී.

**වැඩසටහන සඳහා සහභාගි වූවන් -**





## 5.5 KPMG සමඟ රාජ්‍ය අංශයේ කළමනාකරණ කාර්ය මණ්ඩල නිපුණතා සංවර්ධන වැඩසටහන

**අරමුණු:** රාජ්‍ය අංශයේ ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩලය ශක්තිමත් කිරීම

**ජයග්‍රහනය:** මෙම වැඩමුළුව සඳහා රජයේ අධ්‍යක්ෂවරුන් හා ජ්‍යෝෂ්ඨ විධායක නිලධාරීන් 50 කට අධික පිරිසක් සහභාගි වූහ.

**බලගැන්වීම:** රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ විෂය පථයට අයත් රාජ්‍ය **ව්‍යවසායන්හි** මණ්ඩල පාලන කටයුතු පිළිබඳ වැඩමුළුවක් පැවැත්වීම සඳහා KPMG වරලත් ගණකාධිකාරීවරුන් මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාව සමඟ හවුල් විය. ගරු රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය එරාන් වික්‍රමරත්න සහ KPMG කළමනාකාර හවුල්කරු රියස් මිහුලර් යන මහත්වරු මේ අවස්ථාවට සහභාගී වූහ.





## 5.6 ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය හා ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය සත්කාරක කර්මාන්තය සඳහා ඒකාබද්ධ වෘත්තීය මූල්‍ය හා කළමනාකරණ ගිණුම්කරණය පිළිබඳ පාඨමාලාවක් පැවැත්වීම

සත්කාරක අංශය සඳහා මූල්‍යමය, ගිණුම්කරණ සහ කළමනාකරණ වෘත්තීය අධ්‍යාපන වැඩසටහන් උත්පාදනය කිරීමෙ ප්‍රතිලාභය හඳුනා ගනිමින් ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය සහ ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය සමඟින් " සහතිකලත් සත්කාරක මූල්‍ය කළමනාකරණ ගිණුම්කරණ වැඩසටහන" දියත් කිරීම පිණිස අවශ්‍ය පහසුකම් මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාව විසින් ලබා දෙන ලද අතර ඒ කරා ළඟා වීමේ අරමුණින් ඒකාබද්ධ වැඩසටහනක් පැවැත්වීම පිණිස දෙපාර්ශවයම සහයෝගය ලබා දුණි.

සත්කාරක කර්මාන්තය සඳහා මූල්‍ය හා කළමනාකරණ ගිණුම්කරණය පිළිබඳ දුර්ලභ වෘත්තීය වැඩසටහනක් සඳහා වන වර්තමාන අවශ්‍යතාව මෙම මූලාරම්භය විසින් හඳුනාගෙන ඇත. මෙම සුදුසුකම් ලබාගන්නා අය සුදුසුකම්ලත්, ප්‍රවීණ මූල්‍ය ගිණුම්කරණ, කළමනාකරණ ගිණුම්කරණ වෘත්තිකයන් ලෙස සත්කාරක කර්මාන්තයේ රැකියා අවස්ථා හිමිකරගනු ඇත.

සත්කාරක කර්මාන්තයේ වෘත්තීය සුදුසුකම් විශේෂඥතාවයක් ලබා ගැනීම සඳහා මූල්‍ය ගිණුම්කරණ හා කළමනාකරණ ගණකාධිකරණ අංශයන් තුළ සත්කාරක කර්මාන්තයෙහි විවිධ මට්ටම්හි දැනට සේවයේ නියුතු සියලු දෙනා සඳහා CHFMA වරලත් සත්කාරක මූල්‍ය හා කළමනාකරණ ගිනුම්කරණ ගණකාධිකාරී ආයතනය විසින් දොරටු විවෘත කර දෙනු ඇත.






### 5.7 රාජ්‍ය අංශයේ කළමනාකරණ කුසලතා වර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් කිරීම පිණිස මානව සම්පත් උපාය මාර්ගයක් ගොඩ නැගීම

### 5.7.1 පොදු ප්‍රවීනතා රාමුව

රජයේ සහ අර්ධ රාජ්‍ය අංශයේ සුදුසු පුද්ගලයින් සුදුසු රැකියා සඳහා තෝරාගැනීමේ සහ ඔවුන්ට උසස්වීම් ලබාදීමේ නිවැරදි ක්‍රමවේදයක් සකස් කර නැත. ඒ සඳහා විසඳුමක් ලෙස සේවකයින්ගෙන් කාර්යක්ෂම, ඵලදායී හා ගුණාත්මක සේවාවක් ලබා ගැනීම ඉලක්ක කර ගනිමින් අපගේ සභාව විශේෂඥ කණ්ඩායමකගේ ද සහයෝගය ඇතිව රාජ්‍ය අංශය සඳහා පොදුවේ පිළිගත් ප්‍රවීණතා රාමුවක් සකස් කර ඇත. “ඵලදායී හා මහජන සේවා සංස්කෘතිය සඳහා වන පොදු ප්‍රවීණතා රාමුව” පිළිබඳ සම්පූර්ණ වාර්තාව ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු පිළිබඳ ගරු අමාත්‍යවරයා සහ ලේකම්වරයාගේ අනුමැතියට ඉදිරිපත් කොට ඇත.

### 5.7.2 <u>දේශන මාලාව 2016</u>

රාජ්‍ය සේවකයන්ගේ දැනුම, ආකල්ප වර්ධනය කිරීමේ අරමුණින් විවිධ ක්ෂේත්‍ර වල ප්‍රවීණ සම්පත් දායකයන්ගේ දායකත්වයෙන් නොමිලේ දේශන මාලාවක් පවත්වන ලදී.


| දේශනයේ නම | සම්පත් දායකයා | සහභාගි ගණන | දිනය සහ ස්ථානය |
|---|---|---|---|
| 1. මානව සම්පත් නොවන පුද්ගලයින් සඳහා මානව සම්පත (HR for Non. HR ) | ආචාර්ය අජන්ත ධර්මසිරි මහතා | 76 | <u>2016.05.10</u> නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශ ශ්‍රවණාගාරය |
| 2. ඔබ සහ ඔබේ කණ්ඩායම උනන්දු කිරීම(Motivate your self & your Team) | ඉංජිනේරු රනිල් සුගතදාස මහතා | 100 | <u>2016.06.16</u> නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශ ශ්‍රවණාගාරය |
| 3. රාජ්‍ය අංශයේ සේවා සැපයීම වැඩිදියුණු කිරීම පිණිස මානව සම්පතෙහි කාර්යභාරය (The HR Role in improving Public Sector Delivery) | දිනේෂ් වීරක්කොඩි මහතා | 136 | <u>2016.09.28</u> නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශ ශ්‍රවණාගාරය |
| 4. වෘත්තීය දක්ෂතාවය ජීවන මාර්ගයක් ලෙස (Professionalism as a way of life) | දීපාල් සූරියආරච්චි මහතා | 77 | <u>2016.11.29</u> නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශ ශ්‍රවණාගාරය |

# <u>වැඩසටහන් ඇගයීම</u>

වැඩසටහන අවසානයේදී ලබා දුන් පසුවිපරම් පෝරමයක් මගින් එහි සාර්ථකත්වය මැණ බැලූ අතර එය පහත ප්‍රස්ථාර මගින් දක්වා ඇත.

### 5.7.2.1 මානව සම්පත් නොවන පුද්ගලයින්(දිනන මනස) HR for Non. HR

***1 රූපසටහන: එක් එක් ඇගැයීම් කාණ්ඩය සඳහා සහභාගී වන්නන් සංඛ්‍යාව % ක් ලෙස***





රූප සටහන් 1 ට අනුව 62% ක් සහභාගී වූවන් ඉහත වැඩසටහන විශිෂ්ඨ බවද. සහභාගී වන්නන්ගෙන් 38% ඉහත වැඩසටහන ඉතා හොඳ හෝ හොඳ බව පවසා සිටි අතර, එය දුර්වල හෝ සාමාන්‍ය බව කිසිවෙක් විසින් පවසා නොමැත.





### 5.7.2.2 ඔබ සහ ඔබේ කණ්ඩායම උනන්දු කරවන්නේ කෙසේද(Motivate yourself and your Team)

*2. රූපසටහන: එක් එක් ඇගැයීම් කාණ්ඩය සඳහා සහභාගි වන්නන් සංඛ්‍යාව % ක් ලෙස*




රූප සටහන් 2 ට අනුව 68% ක් සහභාගී වූවන් ඉහත වැඩසටහන විශිෂ්ඨ බවද. සහභාගී වන්නන්ගෙන් 32% ඉහත වැඩසටහන ඉතා හොඳ හෝ හොඳ බව පවසා සිටි අතර, එය දුර්වල හෝ සාමාන්‍ය බව කිසිවෙක් විසින් පවසා නොමැත.






**5.7.2.3 රාජ්‍ය අංශයේ සේවා සැපයීම වැඩිදියුණු කිරීම පිණිස මානව සම්පතෙහි කාර්යභාරය**

(The HR Role in improving Public Sector Delivery)

***3. රූපසටහන: එක් එක් ඇගැයීම් කාණ්ඩය සඳහා සහභාගී වන්නන් සංඛ්‍යාව % ක් ලෙස***





රූප සටහන් 3 ට අනුව 71.6% ක් සහභාගී වූවන් ඉහත වැඩසටහන විශිෂ්ඨ හෝ ඉතා හොඳ බවද, සහභාගී වන්නන්ගෙන් 23.9% ඉහත වැඩසටහන හොඳ බවද පවසා සිටි අතර, එය දුර්වල හෝ සාමාන්‍ය බව පවසන ලද්දේ 4.5%ක පමණ පිරිසකි.






**5.7.2.4**: **වෘත්තීය දක්ෂතාවය ජීවන මාර්ගයක් ලෙස** (Professionalism as a way of life)

***4.රූපසටහන: එක් එක් ඇගැයීම් කාණ්ඩය සඳහා සහභාගි වන්නන් සංඛ්‍යාව % ක් ලෙස***




රූප සටහන් 4 ට අනුව 95.5% ක් සහභාගී වූවන් ඉහත වැඩසටහන විශිෂ්ඨ බව හෝ ඉතා හොඳ බව ද සහභාගී වන්නන්ගෙන් 4.5% ඉහත වැඩසටහන හොඳ බව ද පවසා සිටි අතර, එය දුර්වල හෝ සාමාන්‍ය බව කිසිවෙක් විසින් පවසා නොමැත.





### 5.8 රැකියා අරුණ වෘත්තීය අභිප්‍රේරණ වැඩසටහන - 2016

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව, ජාතික වාණිජ මණ්ඩල, වෘත්තීය පුහුණු ආයතන, කලාපීය අධ්‍යාපන කාර්යාල, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාල එක්ව රැකියා අපේක්ෂිතයන් හා රැකියා අවස්ථාවන් ලබා දීමට හැකි පෞද්ගලික කර්මාන්තශාලා එක්ව "රැකියා අරුණ" වෘත්තීය අභිප්‍රේරණ වැඩසටහන් මාලාව මඟින් කළුතර, රත්නපුර, නුවර, කොළඹ යන දිස්ත්‍රික්කයන්හි වැඩසටහන් 4 ක් පවත්වන ලදී.

මේ සඳහා විභාග දෙපාර්තමේන්තුවෙන් ලබා ගත් 2014 වර්ෂයේ උසස් පෙළ විභාගය සඳහා පෙනී සිටි පෞද්ගලික අයදුම්කරුවන්ගේ පෞද්ගලික ලිපිනයන් අනුව ඔවුන්ට ආරාධනා ලිපියක් යොමු කිරීම මඟින් සහභාගී වීමට අවශ්‍ය තොරතුරු ලබා දෙන ලදී. එමෙන්ම බැනර්, පෝස්ටර්, අදාල දිස්ත්‍රික්කයන්හි ප්‍රදර්ශනය කළ අතරම ලක් හඬ ගුවන් විදුලි නාලිකාවේ මේ පිළිබඳ ප්‍රචාරණ කටයුතු සිදු කරන ලදී.

| දිනය | දිස්ත්‍රික්කය | ස්ථානය | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| 2016.2.13 | කළුතර | ශ්‍රීපාලි මණ්ඩපය | 270 |
| 2016.5.12 | රත්නපුර | ඩී.ඒ. රාජපක්ෂ ශාලාව | 550 |
| 2016.7.12 | මහනුවර | පොල්ගොල්ල සමුපකාර සං. ආයතනය | 499 |
| 2016.11.26 | කොළඹ | පන්නිපිටිය ධර්මපාල විද්‍යාලය | 418 |

***වැඩමුළුව සඳහා සහභාගි වූ රැකියා සපයන ආයතන***

| | |
|---|---|
| 1. යුනියන් ඇෂුවරන්ස් | 11. එලයින්ස් ඉන්ෂුරන්ස් (පුද්ගලික) සමාගම |
| 2. ජනශක්ති ඉන්ෂුවරන්ස් | 12. කාගිල්ස් ලංකා සමාගම |
| 3 .සෙලින්කෝ ලංකා | 13. හමීඩියා ස්ටාර්ස් (පුද්ගලික) සමාගම |
| 4. ඩීබග් සමූහ ව්‍යාපාරය | 14. ඒ එම් ඩබ් (පුද්ගලික) සමාගම |
| 5. සෙලින්කෝ ලයිෆ් | 15. හයිඩ්‍රාමනි සමාගම |
| 6. ඩෙල්මේජ් ආයතනය | 16. GP ගාමන්ට් |
| 7. හේලික්ස් ඉංජිනේරු (පුද්ගලික) සමාගම | 17. සී/ස කාගිල්ස් ෆුඩ් (පුද්ගලික) සමාගම |
| 8. ලාෆ් සුපමාර්කට් (පුද්ගලික) සමාගම | 18. ලංකා ඉන්ටෙලිජන්ට් ඉමේජ් මැනේජ්මන්ට් සමාගම |
| 9. තන්ත්‍රි ටේලර්ස් (පුද්ගලික) සමාගම | 19. ලීඩර් ට්‍රැවල්ස් ඇන්ඩ් ටුවර්ස් (පුද්ගලික) සමාගම |
| 10. මාස් ඇක්ටිව් | 20. සිංගර් ශ්‍රී ලංකා (පුද්ගලික) සමාගම |

ඇඹිලිපිටිය



කොළඹ




කළුතර



මහනුවර



## 5.9 පුවත් ලිපිය – මානව ප්‍රාග්ධන අන්තර් දෘෂ්ඨිය

සමාලෝචනයට බඳුන් වූ වර්ෂය තුල, අප විසින් සිදුකරන ලද නව ක්‍රියාකාරකම් සහ වැඩසටහන් සම්බන්ධයෙන් අදාළ පාර්ශ්වයන් දැනුවත් කිරීම සඳහා පුවත්ලිපියක් සැකසීමට සහ පළකිරීමට මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාවට හැකි විය. පාර්ශ්වකරුවන් අතර පුවත්හසුන් බෙදා හරින ලදී.

## 5.10 මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව තුළ ඵලදායිතාව හා තත්ත්වය ඉහළ නැංවීම.

***<u>මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව ගුණාත්මක සේවාවක් සැපයීම සඳහා ISO 9001:2015 ප්‍රමිති සහතිකය ලබා ගනිමින් තවත් ඉදිරියට.</u>***

අනාගතය සඳහා සූදානම් ශ්‍රම බලකායයක් යන දැක්ම සහිත මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව ශ්‍රී ලංකාවේ මානව සම්පත සංවර්ධනය කිරීම වෙනුවෙන් කාර්යක්ෂම සහ කාර්ය සඵල බවින් යුතු සේවාවක් සැපයීම සඳහා කැපවී සිටින්නෙමු. මෙම අරමුණ සාධනීය කර ගැනීම සඳහා ISO 9001:2015 තත්ත්ව ප්‍රතිපත්තියට අනුව කටයුතු කරමින් අප ආයතනය විසින් සපයනු ලබන සේවාව වඩාත් ඵලදායි හා ගුණාත්මක අයුරින් සැපයීමට කටයුතු කරන ලදී.

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිර්දේශ කරන ලද ප්‍රමිතීන්ට අනුකූලව අවශ්‍ය ලිපි ලේඛන හා අනෙකුත් ආයතනික ලිපි ගොනු සකස් කොට විධිමත් ක්‍රමවේදයකට අනුව සමස්ත ආයතනික ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන ලදී.


ISO 9001:2015 නව තත්ත්ව ප්‍රතිපත්තිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනකට 2015.12.15 වන දින ආයතනයේ නිළධාරීන් තිදෙනෙකු සහභාගී වූ අතර, එමගින් නව තත්ත්ව ප්‍රතිපත්තියේ සිදුවූ සංශෝධනයන් කවරේද යන්න පිළිබඳ අවබෝධය ලබා ගන්නා ලදී. එමෙන්ම ආයතනයේ කටයුතු ISO 9001:2015 ප්‍රමිතියට අනුකූලව සිදුවනවාද යන්න අධීක්ෂණය කිරීම සඳහා අභ්‍යන්තර තත්ත්ව විගණනයක් සිදු කිරීමට ආයතනයේ අභ්‍යන්තර තත්ත්ව විගණන කමිටුව පුහුණු කිරීම ද සිදු කරන ලදී. මෙම පුහුණු කිරීමේ කාර්ය විධිමත් ක්‍රමවේදයකට සම්බන්ධ කරගත් **"Quality Trilogy Consultancy & Training Services"** යන ආයතනයේ උපදේශකත්වය යටතේ 2016.11.21 වන දින සිදු කරන ලදී.

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ නිළධාරීන්ගේ සහභාගීත්වයෙන් අවසන් තත්ත්ව විගණනය 2016.12.07 වන දින දවස පුරා සිදු කළ අතර, එහිදී අප ආයතනය ISO 9001:2015 තත්ත්ව ප්‍රතිපත්තියට අනුගතව කටයුතු කරනු ලබන ආයතනයක් ලෙස නිර්දේශ කරන ලදී. එදින සහභාගී වූ විගණන කමිටු සාමාජිකයන්ගේ උපදෙස් පරිදි අප ආයතනය තුළ ක්‍රියාත්මක කරනු ලබන තත්ත්ව කළමනාකරණ පද්ධතිය (Quality Management System) තව දුරටත් වර්ධනය කරමින් 2017 වර්ෂය තුළ ද ගුණාත්මක සේවාවක් සැපයීම සඳහා සූදානමින් සිටී.

## 5.11 2016 වසර තුළදී මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාවේ සිදු කරන ලද පර්යේෂණ වාර්තා හා ප්‍රකාශන




මානව ප්‍රාග්ධන අන්තර් දෘෂ්ඨිය




මානව ප්‍රාග්ධන සමුළුවේ සම්මේලන වාර්තාව





සංචාරක කර්මාන්තය පුරෝකථනය **2016-2020**




පොදු ප්‍රවීණතා රාමුව



සංවර්ධන අවශ්‍යතා හා ගැටළු පිළිබඳ අධ්‍යයනය - මාතර දිස්ත්‍රික්කය



වෘත්තීය පුහුණු ආයතනයන්හි පුහුණුව ලැබූවන් පිළිබඳ අන්වේශා අධ්‍යයනය– මාතර දිස්ත්‍රික්කය.

## 6. 2016 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

ශ්‍රී ලං.රු.

| | සටහන | 2016 | 2015 | අයවැයගත |
|---|---|---|---|---|
| **වත්කම්** | | | | |
| **ජංගම වත්කම්** | | | | |
| මුදල් හා ඒ හා සමාන දෑ | 1 | 9,877,733.94 | 2,323,986.29 | 2,757,030.58 |
| ලැබිය යුතු දෑ | 2 | 71,162.82 | 71,162.82 | 71,162.82 |
| භාණ්ඩ ලේඛන | 3 | 564,975.70 | 562,194.63 | 562,000.00 |
| පූර්ව ගෙවීම් | 4 | - | 179,949.64 | 190,000.00 |
| අනිකුත් ජංගම වත්කම් | 5 | 2,668,029.66 | 2,131,857.17 | 2,810,000.00 |
| | | **13,181,902.12** | **5,269,150.55** | **6,390,193.40** |
| **ජංගම නොවන වත්කම්** | | | | |
| යටිතල පහසුකම්,පිරියත සහ උපකරණ | 6 | 5,633,698.01 | 6,599,800.71 | 13,000,000.00 |
| වාහන | 6 | 13,183,305.94 | 5,197,328.77 | 4,677,595.89 |
| අනිකුත් වත්කම් | 6 | 779,918.91 | 879,571.14 | 900,000.00 |
| | | 19,596,922.86 | 12,676,700.62 | 18,577,595.89 |
| **මුළු වත්කම්** | | **32,778,824.98** | **17,945,851.17** | **24,967,789.29** |

**වගකීම්**

**ජංගම වගකීම්**

| | | | | |
|---|---|---|---|---|
| ගෙවිය යුතු දෑ | 7 | 846,668.75 | 316,701.07 | 254,046.47 |
| කෙටිකාලීන සැපයුම් | 8 | 313,742.82 | 318,242.82 | 313,742.82 |
| | | **1,160,411.57** | **634,943.89** | **567,789.29** |
| **ජංගම නොවන වත්කම්** | | | | |
| සේවක ප්‍රතිලාභ | 9 | 1,509,772.75 | 1,860,905.88 | 1,900,000.00 |
| | | **1,509,772.75** | **1,860,905.88** | **1,900,000.00** |
| **මුළු වගකීම්** | | **2,670,184.32** | **2,495,849.77** | **2,467,789.29** |
| **ශුද්ධ වත්කම්** | | **30,108,640.66** | **15,450,001.40** | **22,500,000.00** |
| **ශුද්ධ වත්කම්/කොටස්** | | | | |
| **<u>ප්‍රාග්ධන දායකත්වය</u>** | | | | |
| දායකත්ව ප්‍රාග්ධන | | 3,000,000.00 | 3,000,000.00 | 3,000,000.00 |
| ප්‍රතිආගණන සංචිත | | 13,490,249.80 | 2,063,777.20 | 6,000,000.00 |
| රජයේ ප්‍රදාන - ප්‍රාග්ධන | | 15,435,982.49 | 13,148,819.55 | 15,500,000.00 |
| සමුච්චිත අතිරික්ත/(හිඟ) | | (1,817,591.63) | (2,762,595.35) | (2,000,000.00) |
| **මුළු ශුද්ධ වත්කම්/කොටස** | | 30,108,640.66 | 15,450,001.40 | 22,500,000.00 |

සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය)<br>දිනය:

සභාපති<br>දිනය:

## 7. 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

ශ්‍රී ලං.රු.

| | සටහන | 2016 | 2015 | අයවැයගත |
|---|---|---|---|---|
| **ආදායම** | | | | |
| රජයේ ප්‍රදාන - පුනරාවර්තන | 10 | 21,500,000.00 | 19,830,000.00 | 21,000,000.00 |
| රජයේ ප්‍රදාන - ප්‍රාග්ධන | | | 8,866,349.84 | |
| | 11 | 11,389,837.06 | | 12,900,000.00 |
| අනිකුත් ප්‍රදාන | 12 | 1,073,187.14 | - | 1,000,000.00 |
| වත්කම් බැහැර කිරීම පිළිබඳ ලේඛණය | 13 | (5,662.59) | (15,625.68) | (7,000.00) |
| වෙනත් ආදායම | 14 | 185,137.58 | 112,813.48 | 195,000.00 |
| **මුළු ආදායම** | | **34,142,499.19** | **28,793,537.64** | **35,088,000.00** |
| **වියදම්** | | | | |
| වේතන,වැටුප් සහ සේවක ප්‍රතිලාභ | 15 | 15,706,158.54 | 15,622,203.63 | 15,150,500.00 |
| ප්‍රදාන සහ අනිකුත් හුවමාරු ගෙවීම් | 16 | 6,663,006.94 | 3,939,763.41 | 8,285,000.00 |
| සැපයුම් සහ භාවිතාකළ පාරිභෝජන භාණ්ඩ | 17 | 789,950.36 | 674,309.01 | 742,650.00 |
| ක්ෂයවීම් සහ ක්‍රමක්ෂණ වියදම් | 6 | 5,076,989.77 | 5,193,891.31 | 5,100,000.00 |
| ප්‍රවාහන, යැපීම් දීමනා සහ දීමනා | 18 | 189,902.50 | 147,587.50 | 290,880.00 |
| උපයෝගීතා සහ සේවාවන් | 19 | 3,196,272.23 | 3,031,239.97 | 3,326,600.00 |
| නඩත්තු වියදම් | 20 | 1,396,272.13 | 1,324,023.91 | 1,005,000.00 |
| අනිකුත් වියදම් | 21 | 208,988.00 | 174,647.50 | 195,500.00 |
| **මුළු වියදම්** | | **33,197,495.47** | **30,107,666.24** | **34,096,130.00** |
| **කාලසීමාව සඳහා අතිරික්තිය/(හිඟය)** | | **945,003.72** | **(1,314,128.60)** | **991,870.00** |

## 8. 2016 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ශුද්ධ වත්කම්/කොටස් වල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය

ශ්‍රී ලං.රු.

| | පාලන ආස්ථිතියෙහි හිමිකරුවන් සඳහා ආරෝපිත | | | | |
|---|---|---|---|---|---|
| | දායක ප්‍රාග්ධනය | ප්‍රතිආගණන සංචිතය | රජයේ ප්‍රදාන - ප්‍රාග්ධනය | සමුච්චිත අතිරික්තය/ (හිඟයන්) | සමස්ත ශුද්ධ වත්කම්/කොටස් |
| දෙසැම්බර් 31 දිනට ඉදිරියට ගෙන ආ ශේෂය | 3,000,000.00 | 1,808,200.00 | 16,776,387.93 | (3,123,652.33) | 18,460,935.60 |
| බැහැර කළ වත්කම් මත ප්‍රතිගණනය කළ අතිරික්තය | - | - | - | - | - |
| රජයේ ප්‍රදාන සඳහා මාරුකිරීම් - ආදායම | - | - | (3,882,047.84) | - | (3,882,047.84) |
| ශුද්ධ වත්කම්/කොටස් වල සෘජුව හඳුනාගත් ශුද්ධ ආදායම | - | 1,956,877.20 | 5,238,781.46 | (26,114.42) | 7,169,544.24 |
| කාලසීමාව සඳහා අතිරික්තය/හිඟය | | | | | |
| ප්‍රතිගණනය කළ වත්කම් මත පූර්ව ප්‍රතිගණන අතිරික්තය | - | (1,701,300.00) | - | 1,701,300.00 | - |
| විලම්බිත ආදායම | - | - | (4,984,302.00) | - | (4,984,302.00) |
| කාලසීමාව සඳහා අතිරික්තය/හිඟය | - | - | - | (1,314,128.60) | (1,314,128.60) |
| කාලසීමාව සඳහා හඳුනාගත් මුළු ආදායම සහ වියදම් | - | 255,577.20 | (3,627,568.38) | 361,056.98 | (3,010,934.20) |
| **2015 දෙසැම්බර් 31 දිනට ඉදිරියට ගෙන ආ ශේෂය** | **3,000,000.00** | **2,063,777.20** | **13,148,819.55** | **(2,762,595.35)** | **15,450,001.40** |
| 2016 ජනවාරි 1 දිනට ඉදිරියට ගෙන ආ ශේෂය | 3,000,000.00 | 2,063,777.20 | 13,148,819.55 | (2,762,595.35) | 15,450,001.40 |
| පූර්ව වර්ෂයේ ගැලපීම | - | - | - | - | - |
| බැහැර කළ වත්කම් මත ප්‍රතිගණනය කළ අතිරික්තය | - | 11,426,472.60 | - | - | 11,426,472.60 |
| රජයේ ප්‍රදාන සඳහා මාරුකිරීම් - ආදායම | | | (6,656,903.22) | - | (6,656,903.22) |
| ශුද්ධ වත්කම්/කොටස් වල සෘජුව හඳුනාගත් ශුද්ධ ආදායම | | | 13,677,000.00 | | 13,677,000.00 |
| කාලසීමාව සඳහා අතිරික්තය/හිඟය | | | | | |
| විලම්බිත ආදායම | - | - | (4,732,933.84) | - | (4,732,933.84) |
| කාලසීමාව සඳහා අතිරික්තය/හිඟය | - | - | - | 945,003.72 | 945,003.72 |
| කාලසීමාව සඳහා හඳුනාගත් මුළු ආදායම සහ වියදම් | - | 11,426,472.60 | 2,287,162.94 | 945,003.72 | 14,658,639.26 |
| 2016 දෙසැම්බර් 31 දිනට ඉදිරියට ගෙන ගිය ශේෂය | **3,000,000.00** | **13,490,249.80** | **15,435,982.49** | **(1,817,591.63)** | **30,108,640.66** |

## 9. මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය

**2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ඒකාබද්ධ මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය**

| | 2016 | 2015 |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රිකාරකම්වලින් ප්‍රවාහය** | | |
| අතිරික්තය/(හිඟය) | 945,003.72 | (1,314,128.60) |
| මුදල් නොවන සංචලනයන් | | |
| ක්ෂය වීම් | 5,076,989.77 | 5,193,891.31 |
| පාරිතෝෂික වියදම් | 82,684.87 | 268,050.13 |
| පූර්ව වර්ෂයේ ගැලපීම් | - | - |
| විලම්බිත ආදායම | (4,732,933.84) | (4,984,302.00) |
| ප්‍රතිපාදන සඳහා විගණන ගාස්තු | 4,481.00 | - |
| කාර්ය මණ්ඩල ණය සඳහා පොළිය | (93,554.45) | (74,331.71) |
| විගණන ගාස්තු | 80,500.00 | 80,500.00 |
| දේපල, පිරියත සහ උපකරණ අලෙවිය මත (ලැබීම්)/අලාභ | 5,662.59 | 15,625.68 |
| පාරිභෝගික භාණ්ඩ ගබඩා වල වැඩිවීම් (අඩුවීම්) | (2,781.07) | (114,264.40) |
| පූර්ව ගෙවීම් වල වැඩිවීම් (අඩුවීම්) | 179,949.64 | (14,766.35) |
| කාර්ය මණ්ඩල ණය වැඩිවීම් (අඩුවීම්) | (272,566.68) | (621,929.71) |
| අනිකුත් අත්තිකාරම් මත වැඩිවීම් (අඩුවීම්) | 1,250.00 | - |
| ගෙවිය යුතු දැවල වැඩිවීම් (අඩුවීම්) | 529,967.68 | (67,258.13) |
| අනිකුත් ජංගම වත්කම්වල වැඩිවීම් | (264,855.50) | 6,750.00 |
| ලැබිය යුතු දෑ වල වැඩිවීම් (අඩුවීම්) | - | 210,444.23 |
| ගෙවන ලද විගණන ගාස්තු | (80,519.00) | |
| ගෙවූ පාරිතෝෂික | (433,818.00) | - |
| රාජ්‍ය ප්‍රදාන | 7,020,096.78 | 781,952.16 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය** | **8,036,595.20** | **(633,767.39)** |

| | | |
|---|---|---|
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් මූල්‍ය ප්‍රවාහ** | | |
| ගෘහභාණ්ඩ සහ සවිකිරීම් මිළට ගැනීම | (164,169.00) | - |
| කාර්යාලීය උපකරණ මිළට ගැනීම | (74,750.00) | (37,600.00) |
| විදුලි සවිකිරීම් මිළට ගැනීම | - | - |
| පරිගණක මිළට ගැනීම | (326,600.00) | (5,580.00) |
| වාහන මිළට ගැනීම | - | - |
| කාර්ය මණ්ඩල ණය මත පොළිය | 93,554.45 | 74,331.71 |
| මෘදුකාංග මිළට ගැනීම | - | - |
| පොත් මිළට ගැනීම | (11,883.00) | (2,020.00) |
| අනිකුත් වත්කම් මිළට ගැනීම | - | (56,075.00) |
| පිරියත සහ උපකරණ විකිණීමෙන් ලැබෙන මුදල් | 1,000.00 | 2,937.00 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් වන ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(482,847.55)** | **(24,006.29)** |
| | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් වන මුදල් ප්‍රවාහය** | **-** | **-** |
| මුදල් හා මුදල් හා සමාන දෑවල ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | 7,553,747.65 | (657,773.68) |
| කාල පරිච්ඡේදය ආරම්භයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ | 2,323,986.29 | 2,981,759.97 |
| **කාල පරිච්ඡේදය අවසානයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ** | **9,877,733.94** | **2,323,986.29** |

**මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට සටහන්**

අතැති මුදල් සහ බැංකු ශේෂය

| | | |
|---|---|---|
| මහජන බැංකු ගිණුම් අංකය - 119100120409161 | 487,712.25 | 472,404.47 |
| ලංකා බැංකු ගිණුම් අංකය - 165197 | 9,390,021.69 | 1,851,581.82 |
| | **9,877,733.94** | **2,323,986.29** |

## 10. සටහන්

| | | 2016 | 2015 | අයවැයගත |
|---|---|---|---|---|
| <u>මුදල් හා මුදල් සමාන දෑ</u> | 1 | | | |
| මහජන බැංකු ගිණුම් අංකය 119100120409161 | | 487,712.25 | 472,404.47 | 757,030.58 |
| ලංකා බැංකු ගිණුම් අංකය 165197 | | 9,390,021.69 | 1,851,581.82 | 2,000,000.00 |
| | | **9,877,733.94** | **2,323,986.29** | **2,757,030.58** |
| <u>ලැබිය යුතු දෑ</u> | 2 | | | |
| | | | - | - |
| නිමල් බෝපගේ (හිටපු සභාපති) | | 71,162.82 | 71,162.82 | 71,162.82 |
| | | **71,162.82** | **71,162.82** | **71,162.82** |
| <u>භාණ්ඩ ලේඛණ</u> | 3 | | | |
| පාරිභෝගික භාණ්ඩ ගබඩා | | 564,975.70 | 562,194.63 | 562,000.00 |
| | | **564,975.70** | **562,194.63** | **562,000.00** |
| <u>පූර්ව ගෙවීම්</u> | | | | |
| වාහන රක්ෂණය | 4 | - | 149,949.64 | 190,000.00 |
| ශාලා වෙන්කිරීම සඳහා නැවත ලබාගත හැකි අයකිරීම් | | - | 30,000.00 | |
| | | **-** | **179,949.64** | **190,000.00** |
| <u>අනිකුත් ජංගම වත්කම්</u> | 5 | | | |
| කාර්ය මණ්ඩල ණය - ආපදා | | 2,393,174.16 | 2,120,607.17 | 2,800,000.00 |
| උත්සව අත්තිකාරම් | | 10,000.00 | 11,250.00 | 10,000.00 |
| ඉදිකිරීම් WIP | | 264,855.50 | - | |
| | | **2,668,029.66** | **2,131,857.17** | **2,810,000.00** |

## දේපල, පිරියත සහ උපකරණ (සටහන 06)

| | ගෘහ භාණ්ඩ හා සවි කිරීම් | | කාර්යාලයීය උපකරණ | | විදුලි උපකරණ | | පරිගණක | | මෘදුකාංග | | වාහන | | පොත් | | අනෙකුත් වත්කම් | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| වාර්තාගත කාල පරිච්ඡේදය **01.01.2015** සිට **31.12.2015** | **2016** | **2015** | **2016** | **2015** | **2016** | **2015** | **2016** | **2015** | **2016** | **2015** | **2016** | **2015** | **2016** | **2015** | **2016** | **2015** |
| ආරම්භක ශේෂය | **2,075,743.21** | **1,945,637.94** | **2,873,646.29** | **2,803,429.20** | **66,135.25** | **71,555.25** | **4,865,592.98** | **5,616,658.13** | **776,556.61** | **776,556.61** | **18,750,000.00** | **18,950,000.00** | **86,362.15** | **84,347.15** | **1,278,824.50** | **1,015,204.50** |
| එකතු කිරීම් | **164,169.00** | **-** | **74,750.00** | **37,600.00** | **-** | **-** | **326,600.00** | **5,580.00** | **-** | **-** | **14,200,000.00** | **1,500,000.00** | **11,883.00** | **2,020.00** | **-** | **56,075.00** |
| ගැලපීම් | **-** | **130,105.27** | **-** | **59,333.09** | **-** | **(5,420.00)** | **-** | **(744,338.90)** | **-** | **-** | **-** | **-** | **-** | **(5.00)** | **-** | **231,680.00** |
| ක්ෂය කිරීම් | **-** | **-** | **(12,920.00)** | **(26,779.00)** | **-** | **-** | **(1,400.00)** | **(12,306.25)** | **-** | **-** | **(18,750,000.00)** | **(1,700,000.00)** | **-** | **-** | **-** | **(24,135.00)** |
| අවසාන **ශේෂය** | **2,239,912.21** | **2,075,743.21** | **2,935,476.29** | **2,873,646.29** | **66,135.25** | **66,135.25** | **5,190,792.98** | **4,865,592.98** | **776,556.61** | **776,556.61** | **14,200,000.00** | **18,750,000.00** | **98,245.15** | **86,362.15** | **1,278,824.50** | **1,278,824.50** |
| සමුච්චිත ක්ෂය (වර්ෂය ආරම්භය) | **833,625.95** | **580,607.41** | **921,331.07** | **626,349.80** | **26,061.90** | **27,708.77** | **1,877,434.40** | **2,507,100.82** | **399,420.31** | **205,281.16** | **13,552,671.23** | **11,664,520.55** | **75,299.01** | **74,644.05** | **410,316.50** | **294,903.85** |
| ගැලපීම් | **-** | **45,444.22** | **-** | **20,929.14** | **-** | **-** | **-** | **62,883.89** | **-** | **-** | **-** | **-** | **-** | **-** | **-** | **26,957.17** |
| මූල්‍ය කාර්ය සාධන වාර්තාවට අනුව ක්ෂය | **211,165.05** | **207,574.32** | **284,672.16** | **286,635.82** | **4,264.43** | **4,453.13** | **830,718.32** | **803,311.88** | **194,139.15** | **194,139.15** | **3,440,495.43** | **3,588,150.68** | **2,336.07** | **1,059.96** | **109,199.16** | **108,566.37** |
| අඩු කලා ඉවත්කල වත්කම්වල සමුච්චිත ක්ෂය | **-** | **-** | **(7,180,33)** | **(10,658.69)** | **-** | **-** | **(477.08)** | **(11,962.99)** | **-** | **-** | **-** | **-** | **-** | **-** | **-** | **(11,075.89)** |
| ප්‍රත්‍යාගණනය කල වත්කම් වල සමුච්චිත ක්ෂය | **-** | **-** | **-** | **(1,925.00)** | **-** | **(6,099.96)** | **2,707,675.64** | **(1,483,899.20)** | **-** | **-** | **(15,976,472.60)** | **(1,700,000.00)** | **-** | **(405.00)** | **-** | **(9,035.00)** |
| අවසාන **ශේෂය** | **1,044,791.00** | **833,625.95** | **1,198,822.90** | **921,331.07** | **30,326.33** | **26,061.90** | **2,483,117.34** | **1,877,434.40** | **593,559.46** | **399,420.31** | **1,016,694.06** | **13,552,671.23** | **77,635.08** | **75,299.01** | **519,515.66** | **410,316.50** |
| **ඉදිරියට ගෙන එන ශුද්ධ වටිනාකම** | **1,195,121.21** | **1,242,117.26** | **1,736,653.39** | **1,952,315.22** | **35,808.92** | **40,073.35** | | **2,988,158.58** | **182,997.15** | **377,136.30** | **13,183,305.94** | **5,197,328.77** | **20,610.07** | **11,063.14** | **759,308.84** | **868,508.00** |

| **ගෙවියයුතු** | **සටහන් 7** | **2016** | **2015** | **අයවැයගත** |
|---|---|---|---|---|
| දුරකථන | | 21,331.31 | 19,961.80 | 21,000.00 |
| අන්තර්ජාලය | | 13,690.00 | 13,690.00 | 13,690.00 |
| පුවත්පත් බිල්පත් | | | 3,030.00 | 3,000.00 |
| මුරකරු සහ ආරක්ෂක | | 125,356.47 | 125,356.47 | 125,356.47 |
| දේශීය ප්‍රවාහන | | 2,887.50 | - | 2,000.00 |
| තාවකාලික වැටුප් | | - | 27,122.00 | - |
| අතිකාල | | 13,841.78 | 11,880.80 | 13,000.00 |
| නිවාඩුදින දීමනා | | - | 3,490.75 | - |
| විදුලිය සහ ජලය | | 46,295.86 | 53,453.68 | 50,000.00 |
| පාසැල් හැර ගියවුන් පුහුණුව | | - | 4,325.47 | - |
| කුඩා හා මධ්‍ය. වැඩසටහන | | - | 32,097.60 | - |
| ශ්‍රම වෙළඳපල සමීක්ෂණය | | 250,000.00 | 18,582.50 | - |
| මා.ස.උපායමාර්ග සංවර්ධනය | | - | 3,710.00 | - |
| විදේශ පුහුණු වැඩසටහන | | 210,925.71 | - | - |
| MCDP වැඩසටහන | | 35,154.29 | - | - |
| කාර්යමණ්ඩල ශුභසාධනය | | 3,675.00 | - | 4,000.00 |
| කාර්යාල අළුත්වැඩියාව සහ නඩත්තුව | | 14,662.50 | - | 16,000.00 |
| මානව ප්‍රාග්ධන සමුළුව | | 27,315.00 | - | - |
| වැඩබලන වැටුප | | 5,562.08 | - | 6,000.00 |
| ප්‍රචාරණ ගාස්තු | | 76,007.25 | - | - |
| | | **846,668.75** | **316,701.07** | **254,046.47** |

| **කෙටි කාලීන ප්‍රතිපාදන** | **8** | | | |
|---|---|---|---|---|
| විගණන ගාස්තු– 2013 | | - | 85,000.00 | - |
| විගණන ගාස්තු– 2014 | | 81,580.00 | 81,580.00 | 81,580.00 |
| විගණන ගාස්තු– 2015 | | 80,500.00 | 80,500.00 | 80,500.00 |
| විගණන ගාස්තු- 2016 | | 80,500.00 | - | 80,500.00 |
| සැක සහිත ණය සඳහා ප්‍රතිපාදන- එන්.බෝපගේ | | 71,162.82 | 71,162.82 | 71,162.82 |
| | | **313,742.82** | **318,242.82** | **313,742.82** |

| | සටහන | 2016 | 2015 | අයවැයගත |
|---|---|---|---|---|
| **සේවක ශුභසාධන** | **9** | | | |
| පාරිතෝෂික ප්‍රතිපාදන | | 1,509,772.75 | 1,860,905.88 | 1,900,000.00 |
| | | **1,509,772.75** | **1,860,905.88** | **1,900,000.00** |
| **රජයේ ප්‍රදාන - පුනරාවර්තන** | 10 | **21,500,000.00** | **19,830,000.00** | **21,000,000.00** |
| රජයේ ප්‍රදාන - ප්‍රාග්ධන | 11 | | | |
| රජයේ ප්‍රදාන – සංවර්ධන ක්‍රියාවන් | | 6,656,903.22 | 3,882,047.84 | 8,000,000.00 |
| විලම්බිත ප්‍රදාන | | 4,732,933.84 | 4,984,302.00 | 4,900,000.00 |
| | | **11,389,837.06** | **8,866,349.84** | **12,900,000.00** |
| **විදේශ පුහුණු වැඩසටහන්හි ලාභය (අලාභය)** | 12 | 1,073,187.14 | - | 1,000,000.00 |
| | | **1,073,187.14** | **-** | **1,000,000.00** |
| **වත්කම් බැහැර කිරීමේ ලාභය(අලාභය)** | 13 | **(5,662.59)** | **(15,625.68)** | **(7,000.00)** |
| **ආදායම්** | 14 | | | |
| විවිධ ආදායම් | | 91,583.13 | 8,901.20 | 100,000.00 |
| ආපදා ණය පොළිය | | 93,554.45 | 74,331.71 | 95,000.00 |
| IWSS සමීක්ෂණය | | - | 4,580.57 | - |
| ජා.ව.සු. සහතික හිමි - ගාල්ල | | - | 19,000.00 | - |
| ජා.ව.සු. සහතික හිමි - බෙලිඅත්ත | | - | 6,000.00 | - |
| | | **11,389,837.06** | **112,813.48** | **195,000.00** |
| **වේතන, වැටුප්, සේවක ප්‍රතිලාභ** | 15 | | | |
| වැටුප් සහ වේතන | | 7,190,064.68 | 6,349,736.22 | 7,061,000.00 |
| වැඩ බැලීම් වැටුප | | 22,534.12 | 41,049.96 | 7,500.00 |
| විශේෂිත දීමනා | | 768,331.89 | 1,140,090.33 | 800,000.00 |
| ජීවනා දීමනා පිරිවැය | | 2,351,322.58 | 2,359,810.32 | 2,400,000.00 |
| ජීවන දීමනා පිරිවැය | | 1,979,677.42 | 2,644,752.69 | 2,000,000.00 |

| | සටහන | 2016 | 2015 | අයවැයගත |
|---|---|---|---|---|
| ගැලපුම් දීමනාව | | 1,010,525.71 | - | - |
| ප්‍රවාහන දීමනාව | | 400,000.00 | 360,000.00 | 400,000.00 |
| ඉන්ධන දීමනාව | | 210,600.00 | 232,850.00 | 250,000.00 |
| සේ.අ.අ. | | 1,130,291.11 | 1,409,619.21 | 1,500,000.00 |
| සේ.භා.අ. | | 282,554.24 | 352,405.12 | 300,000.00 |
| අතිකාල | | 117,509.17 | 91,894.00 | 120,000.00 |
| නිවාඩුදින ගෙවීම් | | 9,918.75 | 28,544.25 | 12,000.00 |
| තාවකාලික වැටුප් | | 150,144.00 | 343,401.40 | 180,000.00 |
| පාරිතෝෂික වියදම් | | 82,684.87 | 268,050.13 | 120,000.00 |
| | | **15,706,158.54** | **15,622,203.63** | **15,150,500.00** |
| **ප්‍රදාන සහ අනිකුත් මාරුකිරීම් ගෙවීම්** | 16 | | | |
| පුවත් හසුන | | 245,768.00 | 80,928.70 | 350,000.00 |
| ශ්‍රම වෙළඳපල අධ්‍යයනය | | 431,733.75 | 298,004.54 | 680,000.00 |
| කාර්ය මණ්ඩල පුහුණුව සහ සංවර්ධනය | | 1,802,098.87 | 1,218,751.48 | 1,800,000.00 |
| මාතර දිස්ත්‍රික් සමීක්ෂණය | | 81,081.90 | 490,156.72 | 100,000.00 |
| ගුණාත්ම සහ ඵලදායිතා වැඩසටහන | | 144,462.00 | 118,986.47 | 110,000.00 |
| නායකත්වය ගොඩනැගීමට මා.ස. උපායමාර්ග සංවර්ධනය | | 228,695.00 | 162,655.00 | 250,000.00 |
| රැකියා අරුණ වැඩසටහන | | 1,624,177.48 | 964,655.37 | 1,500,000.00 |
| කුසලතා පරතර අධ්‍යයනය තාක්ෂණ අංශය | | 131,449.25 | 36,670.75 | 400,000.00 |
| කු.ම.ව්‍යා ක්ෂේත්‍රය ශක්තිමත් කිරීම | | 529,847.25 | 302,099.53 | 800,000.00 |
| කුසලතා පරතර අධ්‍යයන සංචාරක අංශය | | 905,510.49 | 99,321.55 | 1,000,000.00 |
| අධ්‍යාපන අංශයේ වියදම 6%කට ද.දේ.නි. 1.5% ක් | | - | 66,357.25 | - |
| ශිෂ්‍යයින් සඳහා උපාධි/ඩිප්ලෝමා සඳහා ව්‍යාපෘති යෝජනාව | | - | 101,176.05 | - |

| | සටහන | 2016 | 2015 | අයවැයගත |
|---|---|---|---|---|
| මා.ස.ක.සම්මාන | | 1,310.00 | - | 50,000.00 |
| අධ්‍යක්ෂ අත්පොත (KPMG) | | 122,620.70 | - | 200,000.00 |
| මානව ප්‍රාග්ධන සමුළුව | | 126,203.04 | - | 130,000.00 |
| සංවර්ධන යාන්ත්‍රනය | | 13,165.00 | - | 15,000.00 |
| NHRDC කාර්ය මණ්ඩල සංවර්ධන මුලපිරීම් | | 244,884.16 | - | 900,000.00 |
| | | **6,633,006.94** | **3,939,763.41** | **8,285,000.00** |
| **සැපයුම් සහ භාවිතාකළ පාරිභෝගික භාණ්ඩ** | 17 | | | |
| ලිපිද්‍රව්‍ය සහ කාර්යාල උපකරණ | | 327,750.36 | 342,603.01 | 350,000.00 |
| ඉන්ධන සහ ලිහිසිතෙල් | | 419,555.00 | 331,706.00 | 350,000.00 |
| නිල ඇඳුම් | | -42,645.00 | - | 42,650.00 |
| | | **789,950.36** | **674,309.01** | **742,650.00** |
| **ක්ෂය කිරීම් සහ ක්‍රමක්ෂණ වියදම්** | 6 | **5,076,989.77** | **5,193,891.31** | **5,100,000.00** |
| **ප්‍රවාහන, යැපුම් දීමනා සහ දීමනා** | 18 | | | |
| දේශිය ගමන් සහ යැපුම් දීමනා | | 15,902.50 | 8,387.50 | 68,880.00 |
| විගණන සාමාජික දීමනා | | 54,000.00 | 78,000.00 | 72,000.00 |
| මණ්ඩල සාමාජික දීමනා | | 120,000.00 | 61,200.00 | 150,000.00 |
| | | **189,902.50** | **147,587.50** | **290,880.00** |
| **උපයෝගීතා සහ සේවාවන්** | 19 | | | |
| අනුපාතයන් | | 44,800.00 | 40,320.00 | 40,320.00 |
| විදුලිය | | 659,644.42 | 662,538.20 | 670,000.00 |
| ජලය | | 40,409.78 | 42,825.32 | 40,000.00 |
| දුරකථන ගාස්තු සහ කුලී | | 311,755.89 | 231,154.44 | 340,000.00 |
| තැපැල් සහ ටෙලෙක්ස් ගාස්තු | | 17,470.00 | 8,240.00 | 30,000.00 |

| | සටහන | 2016 | 2015 | අයවැයගත |
|---|---|---|---|---|
| මුරකරු සේවා | | 593,927.64 | 593,927.64 | 593,930.00 |
| වෙළඳ ප්‍රචාරණය | | 202,297.50 | 68,931.00 | 150,000.00 |
| ආරක්ෂක සේවාව | | 910,347.50 | 910,349.50 | 910,350.00 |
| අන්තර් ජාල පහසුකම් | | 164,280.00 | 142,621.40 | 180,000.00 |
| අනිකුත් උපයෝගීතා සහ අනිකුත් සේවාවන් | | 232,517.50 | 249,832.47 | 332,000.00 |
| නෛතික ගාස්තු | | 19,000.00 | - | 40,000.00 |
| | | **3,196,272.23** | **3,031,239.97** | **3,326,600.00** |
| **නඩත්තු වියදම්** | 20 | | | |
| ගොඩනැගිලි සහ ආකෘති අළුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම | | 3,600.00 | 39,037.00 | 15,000.00 |
| වාහන අළුත්වැඩියාව සහ නඩත්තුව | | 1,003,375.79 | 386,873.49 | 400,000.00 |
| වාහන රක්ෂණය | | 149,949.64 | 358,770.10 | 350,000.00 |
| කාර්යාලීය උපකරණ අළුත්වැඩියාව සහ නඩත්තුව | | 117,268.63 | 167,535.40 | 125,000.00 |
| පරිගණක අළුත්වැඩියාව සහ නඩත්තුව | | 57,526.60 | 43,825.50 | 50,000.00 |
| අනිකුත් වත්කම් අළුත්වැඩියාව සහ නඩත්තුව | | 64,506.47 | 327,982.42 | 65,000.00 |
| | | **1,396,227.13** | **1,324,023.91** | **1,005,000.00** |
| **අනිකුත් වියදම්** | 21 | | | |
| විගණන ගාස්තුව | | 80,500.00 | 80,500.00 | 80,500.00 |
| පුවත්පත් සහ වාර ප්‍රකාශන | | 24,380.00 | 68,825.00 | 25,000.00 |
| කාර්ය මණ්ඩල සුභසාධනය | | 47,775.00 | 30,375.00 | 40,000.00 |
| වෛද්‍ය වියදම් | | - | 3,546.00 | - |
| සංග්‍රහ කටයුතු | | 56,333.00 | 50,631.50 | 50,000.00 |
| පුස්තකාල ගාස්තු | | - | 19,500.00 | - |
| නැෂනල් පේපර් කෝ.ලිමිටඩ් | | - | 1,770.00 | - |
| | | **208,988.00** | **174,647.50** | **195,500.00** |

**<u>සටහන් අංක 12 - නිරූපණය</u>**

**<u>ආදායම</u>**

| | |
|---|---|
| පාඨමාලා ගාස්තුව | 8,230,000.00 |

<u>අඩුකළා</u>

**<u>වියදම්</u>**

| | |
|---|---|
| ටිකට්පත් | 1,431,759.00 |
| වීසා | 183,254.00 |
| මැලේසියා පුත්‍ර විශ්ව විද්‍යාල ගෙවීම | 4,584,087.14 |
| සම්පත් දායක ගාස්තු ( දේශීය සැසිය) | 680,000.00 |
| ශාලා වෙන්කිරීම | 210,925.71 |
| සංග්‍රහ කටයුතු | 20,882.00 |
| අනිකුත් | 45,905.01 |
| **මුළු වියදම්** | **7,156,812.86** |
| **විදේශ පුහුණු වැඩසටහන්හි අතිරික්තය(හිඟය)** | **1,073,187.14** |

## 11. වැදගත් ගිණුම්කරන ප්‍රතිපත්තීන් සහ අනිකුත් අර්ථ විවරණ සටහන්වල සාරාංශයකින් සමන්විත සටහන්

**1.** 1997 අංක 18 දරණ පනත යටතේ ශ්‍රී ලංකා මානව සම්පත් සංවර්ධන සභාව ස්ථාපනය කරන ලදී. ආයතනයට පවරා දී ඇති බලතල අනුව, එමඟින් මානව සම්පත් සංවර්ධනයට අදාළ සියළුම ක්‍රියාවන් සඳහා ප්‍රමුඛත්වය ලබාදෙන අතර මානව සම්පත් සංවර්ධනය සඳහා ප්‍රතිපත්ති ක්‍රියාවට නංවනු ලබයි.

**2. ගිණුම් ඉදිරිපත් කිරීම සහ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට බලය ලබාදීම**

මුදල් පනතේ (1971 අංක 38 දරණ) 14 වන වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකා මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාව, රාජ්‍ය සංස්ථාවක් ලෙස එහි සෑම මූල්‍ය වර්ෂයක් අවසන් වීමත් සමඟම සංස්ථාව විසින් වර්ෂය තුළ දී එහි බලතල, කාර්යභාරයන් සහ වගකීම් ක්‍රියාවේ යෙදවීම, ඉටුකරලීම සහ සිදුකරලීම පිළිබඳව සහ එහි ප්‍රතිපත්ති සහ වැඩසටහන් පිළිබඳ ව කෙටුම්පත් කරන ලද වාර්ෂික වාර්තාවක් සකස්කරනු ලබයි. වර්ෂය තුළ අදාළ අමාත්‍යවරයා විසින් සංස්ථාවට දෙනු ලබන කවර හෝ නියෝගයන් එවැනි වාර්තාවක දක්වනු ලබයි. එකී වර්ෂය අවසාන වීමෙන් මාස හතරක් ඇතුළත එවැනි වාර්තාවල පිටපත් අදාළ අමාත්‍යවරයාට සහ මුදල් අමාත්‍යවරයාට (ඔහු අදාළ අමාත්‍යවරයා නොවන්නේ නම්) ක්‍රම සම්පාදන අමාත්‍යවරයාට සහ විගණකාධිපතිවරයාට ඉදිරිපත් කරනු ලබයි.

මුදල් පනතේ (1971 අංක 38) 14 වන වගන්තිය ප්‍රකාරව, සෑම මූල්‍ය වර්ෂයක් සඳහාම වන ගිණුම් ඒ වර්ෂය අවසන් වීමෙන් මාස හතරක් ඇතුළත විගණකාධිපතිවරයා විසින් නිශ්චිතව දක්වා ඇති ආකාරයට ඔහු විසින් අවශ්‍ය කරනු ලබන ගිණුම් පිළිබඳ කිසියම් හෝ වාර්තා සමඟින් විගණනය සඳහා විගණකාධිපතිවරයාට ඉදිරිපත් කරනු ලබයි. මෙකී උප වගන්තියේ පූර්වෝක්ත විධිවිධාන වලට පටහැණි සහ ඒ සමඟින් අනුකූල වීමට අපොහොසත් එවැනි සංස්ථා, මෙම පනත යටතේ වරදකරුවෙක් බවට පත්වන අතර, මහේස්ත්‍රාත්වරයෙක් ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාග කිරීමකින් පසුව වරදකරුවෙක් බවට පත් වුවහොත් රුපියල් දහස නොඉක්මවන දඩයකට යටත් වේ.

**3. අනුකූලතා ප්‍රකාශනය**

ශ්‍රී ලංකා මානව සම්පත් සංවර්ධන සභාවේ ගිණුම්කරණ සම්මුතීන් සකස් කරනු ලබන්නේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ප්‍රකාශයට පත්කරනු ලබන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරන ප්‍රතිපත්තිවලට අනුකූලවය.

## 4. මිනුම් පාදකය

2008, 2011, 2014 සහ 2016 යන වර්ෂ තුළ සමහරක් ගෘහභාණ්ඩ සහ සවිකිරීම්, කාර්යාලීය උපකරණ, විද්‍යුත් සවිකිරීම් සහ උපකරණ. පරිගණක, වාහන සහ අනිකුත් වත්කම් සඳහා ශ්‍රී ලංකා තක්සේරු ආයතනය විසින් සිදුකරනු ලබන ප්‍රත්‍යාගණනයන් හැර, සභාවේ ගිණුම් ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කරනු ලබයි.

## 5. වත්කම් තක්සේරුකරණ පාදක

**5.1** දේපල, පිරියත සහ උපකරණ පිරිවැය/ආගණනයෙන් සමුච්චිත ක්ෂය අඩුකිරීමෙන් පසුව දක්වනු ලබයි.

**5.2** ඇස්තමේන්තුගත ඵලදායී ජීවිතයට එරෙහිව පිරිවැය කපා හැරීම පිණිස සියළුම, පිරියත සහ උපකරණ මත ක්ෂයවීම් අයකරනු ලැබේ.

**5.3** මිළදී ගත් වර්ෂය තුළ ක්ෂයකිරීම් සිදු නොකරන අතර, 2009 වසරට පෙර මිළදී ගත් වත්කම් සඳහා බැහැර කිරීම් සිදුකරන වසරේ දී පූර්ණ වසර සඳහාම ක්ෂයකිරීම් සිදු කරන අතර, 2009 වසරේ සිට සෑම වත්කමක්ම මිළදී ගත්/බැහැර කරන ලද දිනය පදනම් කොට ක්ෂයකිරීම් ගණනය කරනු ලබයි.

**5.4** පාරිභෝගික භාණ්ඩ තොග අවම පිරිවැය සහ ශුද්ධ නිෂ්කාෂණ වටිනාකමට ප්‍රමාණනය කරනු ලබයි.

## 6. ක්ෂයකිරීම

වත්කම් වර්ග සහ ක්ෂයකිරීම් අනුපාතයන් පහත පරිදි වේ. වත්කම් වර්ග තීරණය කරනු ලබන්නේ ආස්ථීතියෙහි වටිනාකම සහ ඒවායේ භාවිතයන්ට අනුවය.

| | |
|---|---|
| ගොඩනැගිලි සහ ආකෘතීන් | 2.5% |
| ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් | 10% |
| කාර්යාල උපකරණ | 10% |
| විද්‍යුත් සවිකිරීම් සහ උපකරණ | 20% |
| පරිගණක | 20% |
| පරිගණක මෘදුකාංග | 25% |
| වාහන | 20% |
| පොත් | 10% |
| අනිකුත් වත්කම් | 10% |

## 7. වාර්තා කරන දිනට පසු සිදුවීම්

සියළුම භෞතික ශේෂපත්‍ර සිදුවීම් සැලකිල්ලට ගෙන සුදුසු ගැලපීම් සිදුකිරීම හෝ මූල්‍ය ප්‍රකාශන සඳහා අනාවරණය කිරිම් සිදුකර ඇත. 2017 ජනවාරි මස සිට ආරම්භ කරන ලද නවීකරණය කරන ලද පරිශ්‍රයේ වැඩ කටයුතු සහ දරණ ලද සියලුම මූලික වියදම් ජංගම වත්කම් යටතේ ක්‍රියාත්මක වෙමින් පවතින කාර්යයන් ලෙස දැක්වේ. ඇස්තමේන්තුගත ප්‍රතිසංස්කරණ වියදම රු. 9,897,587.66 කි.

## 8. රජයේ ප්‍රදාන සඳහා ගිණුම්කරණය

ශ්‍රී ලංකා මානව සම්පත් සංවර්ධන සභාවේ පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් පිළිවෙලින් මහා භාණ්ඩාගාරය වෙතින් ලබා ගන්නා පුනරාවර්තන ප්‍රදාන සහ ප්‍රාග්ධන ප්‍රදාන පිළිවෙලින් යොදාගනු ලබයි. පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාවන් (ජාතික මානව සම්පත් සංවර්ධන සභාවේ ක්‍රියාවන්) සඳහා දරනු ලබන මුදල සහ වර්ෂය තුළ අය කරන ලද ක්ෂයකිරීම් වලට සමාන මුදලක් ප්‍රාග්ධන වත්කම්වල ඵලදායී ආයුකාලය පුරා ආදායම හඳුනා ගනු ලබයි.

## 9. විශ්‍රාම ප්‍රතිලාභ පිරිවැය

### 9.1 නිශ්චිත දායකත්ව සැලැස්ම – සේ.අ.අ සහ සේ. භා.අ.

සේවක අර්ථ සාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල සඳහා සුදුසුකම් ලබන සියලුම සේවා නියුක්තිකයින් අනුකූල ව්‍යවස්ථා සහ නීතිරීති සමඟින් අදාළ දායකත්ව අරමුදලින් ආවරණය කරනු ලබයි. සේ.අ.අරමුදල් සහ සේ.භා.අරමුදල් පනත්වල නීති සහ රෙගුලාසි වලට අනුව සියලුම දායක මුදල් සේවක අර්ථ සාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදලට ප්‍රේෂණය කර ඇත.

### 9.2 විශ්‍රාම පාරිතෝෂිකය

විශ්‍රාම පාරිතෝෂිකය සඳහා මූල්‍ය ප්‍රකාශනයන්හි ප්‍රතිපාදන සපයා දී ඇති අතර, සියලුම සේවා නියුක්තිකයින් සඳහා එය සේවක ප්‍රතිලාභවල ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුකූලව 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත යටතේ ගෙවීම් සඳහා නියමිත වනු ඇත. පාරිතෝෂික වගකීම් සඳහා බාහිර වශයෙන් අරමුදල් සැපයීම හෝ ආයුගණක වශයෙන් ඇගයීම සිදු නොකරයි.

**10. මූල්‍ය කාර්යසාධනය**

ප්‍රාග්ධන වත්කම් මෙහෙයුම් හා නඩත්තු කිරීමේදී දැරූ සියළුම පිරිවැය ආදායම් මත අය කර ඇත. හඳුනාගත් සියලුම වගකීම් සහ වත්කම් ක්ෂයකිරීම් සඳහා ප්‍රතිපාදන සැපයීමෙන් පසුව ආදායම් වියදමෙහි හිඟය/අතිරික්තය කරා ළඟා වී ඇත.

**11. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 2හි 27 වන වගන්තිය මඟින් ඉදිරිපත් කර ඇති වක්‍ර ක්‍රමය භාවිතා කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කරනු ලබයි.

**12. අමාත්‍යාංශය විසින් පවරණ ලද වාහන**

ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශය මගින් වැසි අංක JNICJUD22Z0116541 සහ අංක WP-PD 6170 දරණ වාහනය 2016.02.01 දිනසිට තාවකාලික පදනම මත මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව වෙත වෙන්කර ඇත.

# 12. විගණන විමසුම් හා පිළිතුරු

(70)

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | විවිඑයි/ඊ/එන්එච්ආර්ඩීසී/<br>1/16/20 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2017 ජුනි 20 දින |

සභාපති

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

---

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1997 අංක 18 දරන මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව පනතේ 24 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම</u>

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, .- இல. 306/72, பொல்துூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පටිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථායෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂයපථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරණ මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

2.2.1 ලැබිය යුතු ගිණුම්

හිටපු සභාපතිවරයාගෙන් සභාවට අයවිය යුතු රු. 31,050 ක මුදලත් සහ එම සභාපතිවරයාට සභාවෙන් නිකුත් කර තිබූ රු. 40,112 ක් වටිනා භාණ්ඩ 2016 දෙසැම්බර් 31 දින වන විටද ආපසු ලබාගෙන නොතිබුණි.

3 මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේදී සභාවේ මූල්‍ය ප්‍රතිඵලය රු. 945,003 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපී ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 1,314,128 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 2,259,131 ක වර්ධනයක් නිරීක්ෂණය විය. භාණ්ඩාගාරය විසින් කරන ලද ප්‍රදාන රු. 4,193,487 ක් වැඩි වීම සහ විදේශීය පුහුණු වැඩසටහන් වලින් රු. 1,073,187 ක ලාභ ඉපයීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 හා 2015 වර්ෂවලදී ඌනතාවන් ද අනෙකුත් වර්ෂවලදී මූල්‍ය අතිරික්තයන් ද පෙන්නුම් කෙරුණි. සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය වීම සැලකිල්ලට ගැනීමේදී 2012 වර්ෂයේ රු.8,838,045 ක් වූ ආයතනයේ දායකත්වය 2016 වර්ෂය වන විට රු. 21,728,153 ක් දක්වා අඛණ්ඩ වැඩිවීමක් පෙන්නුම් කෙරුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

1997 අංක 18 දරන මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව පනතෙහි 14(1) ඡේදය පරිදි රැකිරක්ෂා, පුහුණුව සහ අධ්‍යාපනය, විද්‍යාව සහ තාක්ෂණය උපයෝගී කර ගැනීම, ජීවන තත්ත්වය නංවාලීම, අවාසිකර තැනැත්තන්ගේ කණ්ඩායම් (Disadvantaged group) සඳහා සමාජ ආරක්ෂාව සැලසුම් කිරීම ඇතුළු ජාතික මානව සම්පත් ප්‍රතිපත්තියේ සියලු අංශ පිළිබඳ සොයා බලා එම ප්‍රතිපත්ති කලින් කල සමාලෝචනය කිරීම, එම වැඩසටහන් ක්‍රියාත්මකවීම සොයා බැලීම මූලික අරමුණු වේ. එම අරමුණු ඉටුකිරීම සම්බන්ධව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(ඈ) ජාතික මානව සම්පත් ප්‍රතිපත්ති සඳහා විද්‍යාව සහ තාක්ෂණය උපයෝගී කර ගැනීම හා අවාසිතර කණ්ඩායම් සඳහා සමාජ ආරක්ෂාව සැලසුම් කිරීම යන ආණ්ඩුව විසින් අනුමත කරන ලද මානව සම්පත් සංවර්ධන සැලසුම් සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සොයා බැලීම යන අරමුණු ඉටුකර ගැනීම සඳහා සභාව විසින් සමාලෝචිත වර්ෂය තුළදී වැඩ සටහන් ක්‍රියාවට යොදවා නොතිබුණි.

(ඉ) පනත අනුව ජාතික මානව සම්පත් ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීමේ වගකීම, සභාව වෙත පැවරී තිබුණද ආර්ථික කටයුතු පිළිබඳ කැබිනට් අනුකාරක සභාව මඟින් 2012 වර්ෂයේ සිට එය කම්කරු අමාත්‍යාංශය වෙත පවරා තිබුණි.

(ඊ) ක්‍රියාකාරී සැලැස්ම මඟින් ඉලක්ක කළ කාර්යයන් ඉටු කිරීම පිළිබඳ පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2016 වර්ෂය තුළ නිකුත් කිරීමට නියමිත වූ ශ්‍රී ලංකා රැකියා වෙළඳපොළ උපනති පිළිබඳ වාර්තාව 2017 මාර්තු 31 දක්වා ප්‍රකාශයට පත්කර නොතිබුණි.

(ii) සංචාරක, ඇඟළුම් හා තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රවල රැකියා අවස්ථා පිළිබඳ දැනුවත් කිරීම සඳහා ප්‍රාදේශීය වැඩමුළු 15 ක් පැවැත්වීමට රු. 1,500,000 ක් වෙන්කර තිබූ නමුත් සමාලෝචිත වර්ෂය තුළදී රු. 882,000 ක වැය කරමින් සංචාරක ක්ෂේත්‍රය සඳහා වැඩමුළු 6 ක් පමණක් පවත්වා තිබුණි.

(iii) වර්ෂය තුළ පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා කළ ප්‍රතිපාදන වලින් සියයට 24 ක් වැයකර නොතිබූ අතර වැඩසටහන් 3 ක කාර්යසාධනය සියයට 10 සිට 57 දක්වා විය.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1997 අංක 18 දරන මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාව පිහිටුවීමේ පනතේ විධිවිධාන අනුව මානව සම්පත් සංවර්ධනය කිරීම අදාල ප්‍රතිපත්ති උපනයනය කිරීම, ප්‍රවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීමට සහභාගී වීම වෙනුවෙන් අමාත්‍යාංශ 11 ක ලේකම්වරු, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති, වෘත්තීය අධ්‍යාපන ආයතන 4 ක සභාපතිවරු හා අමාත්‍යවරයා විසින් පත්කරන ක්ෂේත්‍රයේ ඉහළ පළපුරුද්දක් ඇති පුද්ගලයන් 5 දෙනෙකු ඇතුළු විද්වත් සාමාජිකයන් 20 දෙනෙකුගේ සමන්විත සභාවක් පත්කර, සමාලෝචිත වර්ෂයේදී රැස්වීම් 3 ක් පවත්වා තිබුණද, ප්‍රතිපත්ති උපනයනය කිරීමට හා එවා ප්‍රවර්ධනය කිරීමට අදාල තීරණ ගෙන නොතිබුණි.

(ඈ) ස්ථාවර වත්කම් ලේඛනයට අනුව පිරිවැය රු. 354,332 ක් වූ ස්ථාවර වත්කම් අයිතම 26 ක් යථාතතිකව නොමැති බව සමීක්ෂණ කමිටු වාර්තාවන් අනුව නිරීක්ෂණය වී තිබුණද ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් පරිදි ක්‍රියාකර නොතිබුණි.

4.3 විධිමත්ව පවරා නොගත් දේපළවල වියාපෘති ආරම්භ කිරීම

බාහිර අමාත්‍යාංශයකට අයත් ගොඩනැගිල්ලක පිහිටුවා ඇති සභා කාර්යාලය නවීකරණය කිරීම සඳහා 2016 දෙසැම්බර් 30 දින පෞද්ගලික කොන්ත්‍රාත්කරුවකු සමඟ රු. 8,916,745 ක වටිනාකමකට කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ තිබුණද සභා කාර්යාලය දීර්ඝකාලීනව එම ගොඩනැගිල්ලෙහි පවත්වාගෙන යාම සඳහා අදාල අමාත්‍යාංශය සමඟ විධිමත් ගිවිසුමකට හෝ අවබෝධතා ගිවිසුමකට එළඹ නොතිබුණු අතර කොන්ත්‍රාත්කරු සමඟ එළඹි ගිවිසුම අනුව නවීකරණයේදී ඉවත් කරන භාණ්ඩ සඳහා රු. 25,000 ක ගාස්තුවක් අය කළද ඉවත් කිරීමට නියමිත වත්කම් හඳුනාගෙන, ලැයිස්තු ගත කර, වටිනාකම් ඇස්තමේන්තු කර නොතිබුණි.

4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 31 ක් වූ අතර 2016 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු 05 ක් විය. කෙසේ වුවද සංස්ථාපිත පනතේ සඳහන් අරමුණු ඉටුකර ගැනීම සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් සභාව සතු නොමැති බව නිරීක්ෂණය විය.

5 ගිණුම්කටයුතු භාවිය හා යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

සභාව තුළ අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නොතිබූ අතර අමාත්‍යාංශ අභ්‍යන්තර විගණන අංශය මගින් ද වර්ෂය තුළ කිසිදු විගණනයක් සිදුකර නොතිබුණි. කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් 2011 නොවැම්බර් 15 දින නිකුත් කර තිබුණු අංක ඩීඑම්ඒ/06 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය මගින් අභ්‍යන්තර පාලන පද්ධතිවල ප්‍රමාණවත් බව ඇගයීම සඳහා අභ්‍යන්තර විගණනයක අවශ්‍යතාවය දක්වා තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(65)

## 6 පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන පිළිබඳ අඩුපාඩු විටින්විට සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) අයවැය පාලනය | වර්ෂය අවසානයේදී අයවැය ලේඛණය සංශෝධනය කර තිබීම. |
| (ආ) වත්කම් පාලනය | වත්කම් ඉවත් කිරීමේදී චක්‍රලේඛ විධිවිධාන අනුගමනය නොකිරීම. |
| (ඇ) කාර්යසාධනය | සභාවේ අරමුණු ඉටුකර ගැනීම සඳහා ප්‍රමාණවත් වැඩසටහන් සකස් කර ක්‍රියාත්මක කිරීම කෙරෙහි අවධානය යොමු නොවීම. |
| (ඈ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය | වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා බාහිර ආයතන තෝරා ගැනීමේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය නොකිරීම. |

එච්.එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති

මගේ අංක: 3/2/12/1 2017.09.21

විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
බත්තරමුල්ල

**මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශණ පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2) සී වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබේ අංක VTY/E/NHRDC/1/16/20 හා 2017.06.20 දිනැති විගණකාධිපති වාර්තාව හා බැඳේ.

ඒ අනුව මාගේ පැහැදිලි කිරීම් පහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

2.2.1 **ලැබිය යුතු ගිණුම් :**

හිටපු සභාපතිතුමා විසින් තව දුරටත් ගෙවීමට ඇති රු.40,112ක මුදල ඔහු ලබාගෙන ඇති ඩිජිටල් කැමරාවක් , Data cable 01ක්, කැමරා බෑගය, External hard Disk 01 වැනි කාර්යාලයීය උපකරණ සඳහා වේ. එය අයකර ගැනීම සඳහා සමථ මණ්ඩලයට පැමිණිල්ලක් ඉදිරිපත් කරන ලදී. වාර 03ක් එම පැමිණිල්ල කැඳවූවද හිටපු සභාපතිතුමා සමථකරණය සඳහා ඉදිරිපත් වූයේ නැත. අධ්‍යක්ෂවරයා විසින් දුරකථන මාර්ගයෙන් එතුමා සමග මේ සම්බන්ධව සාකච්ඡා කර මේ පිළිබඳව පැහැදිලි කිරීමෙන් පසු එතුමා අදාල භාණ්ඩ ලබා දීමට පොරොන්දු වී ඇත. තවද මේ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී සාකච්ඡා කල අතර නඩු නිමිත්ත වී ඇති මුදල අනුව නඩු ගාස්තු ගෙවීම සඳහා දරණ පරිශ්‍රමය ඵලදායී නොවන බැවින් අමාත්‍යාංශ ලේකම්ගෙන් ඒ සඳහා උපදෙස් ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇත.

3. **මූල්‍ය සමාලෝචනය**

3.1 එකඟ වේ.

4. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

**4.1 කාර්ය සාධනය**

(අ) මේ පිළිබඳව 2016 වර්ෂයට පෙර වැඩසටහන් කිහිපයක් සංවිධානය කර ක්‍රියාත්මක කරන ලදි. එහෙත් මෙම වසරේදී විද්‍යාව හා තාක්ෂණය උපයෝගී කර ගැනීම පිළිබඳ විශේෂයෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. මන්ද ආයතනික පනතෙහි සියළුම අරමුණු එක් වර්ෂයකදී ඉටු කර ගැනීමට ආයතනය තුල සම්පත් ප්‍රමාණවත් නොවීම මත, පවතින සම්පත් යොදා ගනිමින් වඩාත් ප්‍රමුඛතාවයන් සහිත ව්‍යාපෘති 17 ක් 2016 වසර තුලදී ක්‍රියාත්මක කරන ලදි.

(ආ) ජාතික මානව සම්පත් ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීමට අදාල කටයුතු සම්බන්ධයෙන් කම්කරු දෙපාර්තමේන්තුවෙහි මිනිස්බල අංශය මඟින් කටයුතු කරමින් පවතින බැවින් අප ආයතනයද එම කාර්යයෙහි නිරත වුවහොත් රාජ්‍ය සම්පත් නාස්තියක් සිදු වන බැවින් මේ වන විට අප ආයතනය මිනිස් බල අංශය සමඟ එක්ව අදාල කාර්ය සිදු කිරීමට සහයෝගය ලබා දීමට කටයුතු කර ඇත.

(ඇ) (i). රැකියා වෙළෙඳපොළ පිළිබඳ කෙටුම්පත් වාර්ථාව ලබා දීමට භාරව සිටි ආචාර්ය දුනුසිංහ මහතා විදේශගත වී ඇති බැවින් එම වාර්තාව ලබා දීමට තව දුරටත් ප්‍රමාදවන බව දන්වා ඇත. එම නිසා 2017 දෙසැම්බර් 15 දිනට ප්‍රථම එම අවසන් වාර්තාව ලබා දෙන ලෙසත් ඒ සම්බන්ධ සොයා ගැනීම් ඉදිරිපත් කරන ලෙසත් (Presentation) ලිඛිතව දැනුම් දී ඇත.

ii) එකඟ නොවෙමි.

සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට අනුව සංචාරක, ඇඟළුම් හා තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍ර වල රැකියා අවස්ථා පිළිබඳ දැනුවත් කිරීමේ ප්‍රාදේශීය වැඩමුළු පැවැත්වීමට නියමිතව තිබුනේ 6ක් පමණි. එය සැලසුම් කළ පරිදි පවත්වන ලදි.

(iii) සංශෝධිත ක්‍රියාකාරි සැලැස්ම අනුව කුඩා පරිමාණ ව්‍යවසායකයන් හඳුනාගෙන සවිබල ගැන්වීමේ වැඩසටහන යටතේ වැඩමුළු 6ක් පැවැත්වීමට සැලසුම් කළ අතර එම වැඩසටහන් 6ම නිම කරන ලදි.

පර්යේෂණ හා සංවර්ධන කටයුතු යටතේ භෞතික ප්‍රගතිය 10% සිට 57% දක්වා වූ ව්‍යාපෘති පහත පරිදි වේ.

**1. 14 (1) ශ්‍රී ලංකාවේ රැකියා වෙලඳපොලේ උපනතීන් පිළිබඳ වාර්ෂික වාර්ථාව**

රැකියා වෙළෙඳපොළ පිළිබඳ කෙටුම්පත් වාර්ථාව 2017 දෙසැම්බර් මස අග වන විට ප්‍රකාශයට පත් කිරීමට කටයුතු යොදා ඇත.

2. **14(2) තාක්ෂණික ක්ෂේත්‍රයේ කුසලතා පරතර අධ්‍යයනය අවසන් කිරීම**

තොරතුරු තාක්ෂණික ක්ෂේත්‍රයේ කුසලතා පරතරය අධ්‍යනය ව්‍යාපෘතියට අදාලව තොරතුරු තාක්ෂණ කමිටුවක් පත්කොට සාකච්ඡා වාර කිහිපයක ප්‍රතිපලයක් ලෙස ක්ෂේත්‍රයේ ප්‍රවීණයෙකු මඟින් ස්වේච්ඡාවෙන් වාර්ථාවක් සකස් කළ අතර එය මානව ප්‍රාග්ධන සමුළුවට අප විසින් ඉදිරිපත් කරන ලදී. තවදුරටත් තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය පිලිබඳ අධ්‍යනයන් සීමිත වූ බැවින් කමිටුවේ නිර්දේශ මත සමීක්ෂණයක් පැවැත්වීමට අප විසින් කටයුතු කල යුතු අතර ප්‍රශ්නාවලිය සඳහා ප්‍රතිචාර ලබා දී තිබුණේ 11 දෙනෙකු පමණි. එය පර්යේෂණ වාර්ථාවක් සඳහා ප්‍රමාණවත් නොවන බැවින් නැවත සිහි කැඳවීම් කර තොරතුරු ලබා ගැනීමට උත්සහ දරණ ලදී.

3. **AHRP සහය ඇතිව මානව සම්පත් කලමණාකරණ ප්‍රධානයන් පැවැත්වීම.(Human Capital Award)**

AHRP වැඩසටහන 2017 වර්ෂයේදී නිම කිරීමට කටයුතු කර ඇති අතර එහි පෞද්ගලික අංශයට අදාල ප්‍රදානෝත්සවය මේ වන විට නිම කර ඇත. රාජ්‍ය අංශයට අදාල ප්‍රධානෝත්සවය මෙම වර්ෂය අවසන් කාර්තුවේ පැවැත්වීමට සැළසුම්කර ඇත.

**4.2 <u>කළමණාකරණ ක්‍රියාකාරකම්</u>**

අ) වර්ෂයක් සඳහා පැවැත්විය යුතු රැස්වීම් ගණන පනතේ නිශ්චිතව සඳහන් කර නොමැත. 2016 වර්ෂය සඳහා වන පළමු රැස්වීමේදී Human Capital Learning conference, Managerial competency Development Program – 2016 යන ව්‍යාපෘති දෙක පිළිබඳව සාකච්ඡා කර ඇත. අනෙකුත් රැස්වීම් දෙකේදී සියළුම ව්‍යාපෘතීන්හි ප්‍රගතිය Presentation මගින් ඉදිරිපත් කර සාකච්ඡා කර ඇත. එම ව්‍යාපෘතීන් ආයතනයෙහි මූලික අරමුණු මුදුන්පත් කරවා ගැනීම උදෙසා සකස් කර ඇත. ඒ පිළිබඳව රැස්වීම් වාර්තාවන්හි සඳහන් වේ.

(ආ) ස්ථාවර වත්කම් ලේඛණයේ පවතින රු. 354,332 ක් වටිනා ස්ථාවර වත්කම් අයිතම 26 සම්බන්ධයෙන් 2016/08/03 දිනැති ලිපියෙන් රේඛීය අමාත්‍යාංශයෙන් අදාල උපදෙස් ලබා ගෙන එම වත්කම් ඉවත් කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා මු.රෙ. 104 අනුව නව පරීක්ෂණ මණ්ඩලයක් 2017/05/23 දින පත් කරන ලදී. එම කමිටු වාර්තාව ඉක්මනින් ලබා දෙන මෙන් අදාල නිළධාරීන්ට දැනුම් දී එම කාර්යය ඉතා ඉක්මනින් නිම කිරීමට කටයුතු කරමි.

**4.3 <u>විධිමත්ව පවරා නොගත් දේපළවල ව්‍යාපෘති ආරම්භ කිරීම</u>**

මගේ අංක 3/1/1/3 හා 2015.10.30 වන දිනැති ලිපිය මඟින් රේඛීය අමාත්‍යාංශයේ ලේකම් හරහා නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයෙන් කාර්යාල පරිශ්‍රය නැවත සකස් කිරීම සඳහා අනුමැතිය ඉල්ලා ඇති අතර එයට අනුමැතිය ලැබී ඇත.

එම භාණ්ඩ නැවත ප්‍රයෝජනයට ගත නොහැකි හා එයට තක්සේරු කල හැකි වටිනාකමක් නොමැති බැවින් ද මෙම අබලි ද්‍රව්‍ය ගොඩගැසීම නිසා ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීම අපහසු බැවින් (Gypsum Board, Carpet, Network & Power Cable, Aluminum Bar) කාර්යාල පරිශ්‍රය නැවත සකස් කිරීම සඳහා වූ ගිවිසුම අනුව මෙම භාණ්ඩ කොන්ත්‍රාත්කරුවන් වෙත ලබා දී ඇත. භාවිතා කල හැකි වටිනාකමක් සහිත භාණ්ඩ අමාත්‍යාංශයේ අනුමැතිය සහිතව රාජ්‍ය ආයතන වෙත ලබා දී ඇත.

4.4 <u>කාර්ය මණ්ඩල පරිපාලනය</u>

මේ වන විට පැවති සහකාර අධ්‍යක්ෂ (මුදල්) හා රියැදුරු පුරප්පාඩු සම්පූර්ණ කර ඇති අතර ඉතිරි පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරමින් පවතී. මානව සම්පත් සංවර්ධන සභා පනත සංශෝධනය කිරීමට කටයුතු කර ඇති අතර ඉදිරියේදී සිදු විය හැකි වෙනස්කම් හේතුවෙන් නව බඳවා ගැනීම් තාවකාලිකව නවතා ඇත.

## <u>5. ගිණුම්කටයුතු භාවය හා යහපාලනය</u>

### 5. 1 අභ්‍යන්තර විගණනය

අංක MNPEA/AD/GEN/NHRDC/06 හා 2016.12.05 දිනැති ලිපිය මඟින් අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන නිළධාරියෙකු නම් කර එවා ඇත.

කේ.ඒ. ලලිතධීර
අධ්‍යක්ෂ
සභාපති වෙනුවට